# රත්නපුරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ ජීව විවිධත්වය සහ ප්‍රාග් ඓතිහාසික වැදගත්කම




BDS BIODIVERSITY SECRETARIAT

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

ENV BD 09

# රත්නපුරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ ජීව විවිධත්වය සහ ප්‍රාග් ඓතිහාසික වැදගත්කම

කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි*

2007

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

*වනජීවී පර්යේෂක
වනජීවී උරුම භාර පුද්ගලික සමාගම
24, කටුකුරුන්ද වත්ත පාර, රත්මලාන
kelum@slt.lk

රත්නපුරය හා ඒ ආශ්‍රිත ප්‍රදේශයේ ජීව විවිධත්වය සහ ප්‍රාග් ඓතිහාසික වැදගත්කම

ප්‍රථම මුද්‍රණය 2007 දෙසැම්බර
© පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය
මෙහි ඇතුළත් කිසිදු කරුණක්, ඡායාරූපයක් හෝ රූපණයක් කර්තෘගේ ලිඛිත අවසරයක් නොමැතිව උපුටා ගැනීම, පළකිරීම හෝ ප්‍රසිද්ධ කිරීම සම්පූර්ණයෙන් තහනම්ය.

ISBN 978-955-9120-86-5

| | | |
|---|---|---|
| කර්තෘ | : | කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි |
| රූපණය | : | කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි |
| ඡායාරූප | : | ඇන්ඩ්‍රියාස් නොලර්ට් (AN)<br>මාධව මීගස්කුඹුර (MM)<br>රාහුල පෙරේරා (RP)<br>රුචිර සෝමවීර (RS)<br>සුදේශ් බටුවිට (SB)<br>සමන් ලියනගේ (SL)<br>සුදත් නානායක්කාර (SN)<br>විමුක්ති වීරතුංග (VW)<br>වනජීවී උරුම භාර පුද්ගලික සමාගම (WHT) |
| සෝදුපත් බැලීම | : | එම්. ඒ. නඳුන් අමන්ද |
| පිටු සැකසුම හා මුද්‍රණය | : | කරුණාරත්න සහ පුත්‍රයෝ සමාගම<br>67, කාර්මික ජනපදය, කටුවාන පාර, හෝමාගම |
| සම්බන්ධීකරණය | : | හසුලා වික්‍රමසිංහ |
| ප්‍රකාශනය | : | ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය<br>පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශය<br>"සම්පත්පාය", 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල |

පිට කවරය
කඳුකර වර්ෂා වනාන්තරයක පසුබිමේ වූ Five bar Swordtail (*Pathysa antiphata*) සමනලයෙක් (VW), *Oligospira* ගනයේ ගස් ගොළුබෙල්ලෙක් (SN), රත්නපුරයෙන් හමු වූ ව්‍යාඝ්‍ර ෆොසිලය, බලංගොඩ මානවයා ගිනි මෙලවීම සඳහා භාවිතා කළ ශිලා මෙවලමක්, ගවරා (*Bos gaurus*) හා බලංගොඩ මානවයා.

# පටුන


පෙරවදන ........ iv

අරමුණ ........ 1

හැඳින්වීම ........ 1

රත්නපුරය හා ඒ ආශ්‍රිත ජීව විවිධත්වය ........ 3

මිරිදිය මසුන් ........ 5

උභයජීවීන් ........ 6

උරගුන් ........ 9

පක්ෂීන් ........ 14

ක්ෂීරපායීන් ........ 18

ප්‍රාග් ඓතිහාසික වැදගත්කම ........ 21

කුරුවිට බටදොඹ ලෙන ........ 29

සමාප්තිය ........ 36

ස්තුතිය ........ 36

# පෙරවදන

ශ්‍රී ලංකාවේ තෙත් කලාපයත්, දකුණු ඉන්දියාවේ බටහිර ඝාට්ස් කඳු හා ඒ ආශ්‍රිත කලාපයත් සමස්තයක් ලෙස ගත් කල දකුණු ආසියාවේ ජීව විද්‍යාත්මකව උණුසුම් කලාපයක් ලෙස ජාත්‍යන්තරව පිළිගෙන තිබේ. රත්නපුරය, ශ්‍රී පාද අඩවිය හා ඒ ආශ්‍රිත කලාපය තෙත් කලාපය මධ්‍යයේ පිහිටි, ජීව විවිධත්වය අතින් අනූන පෙදෙසකි. වළාකුල් වනාන්තර, පහතරට සදාහරිත නිවර්තන වැසි වනාන්තර, තෘණ බිම්, මිටියාවත්, ගංගා, ඇළ දොළ බහුල මේ කලාපය ආවේණික සත්ව හා ශාක අතිවිශාල ප්‍රමාණයක වාසභූමිය වී තිබේ. තවද ප්ලයිස්ටොසීන හා හොලෝසීන සමයන්හි මෙහි විසූ ගවරුන්, සිංහයින්, ව්‍යාඝ්‍රයින්, කගවේනුන් ආදී විශාල සතුන්ගේ පොසිල හමුවන නිසා පාෂාණීභූත විද්‍යාත්මකව ද මේ කලාපයට උරුම වැදගත්කම දෙගුණ තෙගුණ වේ. එපමණක් නොව අදින් වසර 37,000 කට පමණ එපිට මෙහි ජීවත් වූ මෙරට මුල්ම මානවයින්ගේ සැකිලි කොටස් හා ගල් ආයුධ හමුවන ගල් ගුහා හා එළිමහන් ස්ථාන බහුල වන හෙයින් ප්‍රාග් ඓතිහාසික වශයෙන්ද මේ කලාපය අතිශයින් වැදගත් වේ. කෙටියෙන් කිවහොත් මේ කලාපයට අයත්, පෙර කී මානව සාධක බහුලව හමුවන කුරුවිට පිහිටි බටදොඹ ලෙන දකුණු ආසියාවේ වූ වැදගත් ප්‍රාග් මානව වාසස්ථානයක් වේ.

රත්නපුරය, ශ්‍රී පාද අඩවිය හා ඒ ආශ්‍රිත කලාපයට හිමි මෙකී පාරිසරික, පුරාවිද්‍යාත්මක වැදගත්කම සැලකිල්ලට ගෙන ඒ කරුණු පිළිබඳ පොදු ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් පරිසර සහ ස්වභාවික සම්පත් අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය මගින් ප්‍රවීණ වනජීවී පර්යේෂකයෙකු වන කැළුම් නලින්ද මනමේන්ද්‍ර-ආරච්චි මහතා විසින් සම්පාදිත මේ පොත් පිංච එළිදක්වා තිබේ. මෙම ව්‍යායාමයෙන් මේ කලාපය පිළිබඳ මාහැඟි දැනුමක් පමණක් නොව මෙය රැකගැනීමේ වැදගත්කම ද ජනතාවට එත්තු ගැන්වෙන බව මෙම පොත් පිංච කියවීමෙන් පැහැදිලි වේ.

මෙය දැනුම, අවබෝධය තුළින් ජනතාව පාරිසරික සංරක්ෂණය කෙරෙහි යොමු කිරීමට තැබූ වැදගත් පියවරක් බව කිව හැකිය.

ගාමිණී ගමගේ

අධ්‍යක්ෂ

ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

# අරමුණ

මෙම පොත් පිංච ඔබ අතට පත්කිරීමේ මූලික අරමුණ රත්නපුර පෙදෙසේ වර්තමානය හා යටගියාව පිළිබඳ සංක්ෂිප්ත දැනුමක් ඔබට ලබාදීමයි. විශේෂයෙන්ම ප්‍රාග් ඓතිහාසිකව ඉතා වැදගත්කමකින් හෙබි මේ පුරවරය සතු අගය අප තවමත් නිසියාකාරව දැන හැඳිනගෙන නැත. මේ පෙදෙස පිළිබඳව ඉංග්‍රීසි බසින් ලියවී ඇති වඩාත්ම විද්‍යානුකූල පර්යේෂණ ලිපි හා පොත් පත්වල පළවී ඇති කරුණු සාමාන්‍ය ජනතාවටත්, පාසල් සිසුන්ටත් කියවා තේරුම් ගැනීමට අපහසුය. එපමණක් නොව එම මූලාශ්‍ර සපයා ගැනීමද පහසු නැත. එබැවින් මේ පෙදෙසේ පරිසර විද්‍යාත්මක හා ප්‍රාග් ඓතිහාසික අගය හැකි තරම් සරලව කියාදීම මේ පොත් පිංචේ මූලික අරමුණ වේ. රත්නපුරයේ පිහිටි ජාතික කෞතුකාගාරය මූලික කරගෙන මේ පොත සකසා ඇත. එය නැරඹීමේදී මෙයින් ලැබෙන දැනුම ඔබට වඩාත් පිටිවහලක් වන බව අපගේ විශ්වාසය වේ. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේත්, පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේත් ඒකාබද්ධ ව්‍යාපෘතියක ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රකාශනය ඔබ අතට පත්වේ.

# හැඳින්වීම

උතුරු අක්ෂාංශ $5^{\circ}\ 55'$ සහ $9^{\circ}\ 50'$ අතරත්, නැගෙනහිර දේශාංශ $79^{\circ}\ 40'$ සහ $81^{\circ}\ 53'$ අතරත් පිහිටි ශ්‍රී ලංකාව වර්ග කිලෝමීටර් 65,610 ක් පුරා පැතිරී ඇති දූපතකි. මේ දිවයින ඉන්දියාවේ දකුණු තුඩුවට ආසන්නව සමකයට උතුරින් පිහිටා ඇත. ඉන්දියාවත් සමඟ ඇති අවම දුර කිලෝමීටර් 19ක් වේ. මේ ගොඩබිම් කලාප දෙක වෙන්ව ඇත්තේ පෝක් සමුද්‍ර සන්ධියෙනි. කෙසේ වුවත් ඉන්දියාවත්, ශ්‍රී ලංකාවත් එකම මහාද්වීපීය තලයක පිහිටා ඇත. දූපතක් ලෙස වෙන්ව පිහිටීමේ හේතුව නිසා ශ්‍රී ලංකාවට ආවේණික වූ ගස් වැල් හා සතුන්ගේ ප්‍රතිශතය ඉතා ඉහළ අගයක් ගනියි. තෙත් කලාපයක්, අතරමැදි කලාපයක් හා වියළි කලාපයක් ලෙස වෙනස් දේශගුණික ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රධාන පාරිසරික කලාපයන් තුනක් ද මීට අමතරව මන්නාරම හා හම්බන්තොට පෙදෙස්වල ඉතා වියළි තත්ත්වයන්ගෙන් යුත් ශුෂ්ක කලාපයක්


පහතරට නිවර්තන වැසි වනාන්තර (VW)

ද දැකිය හැකිය. රට මධ්‍යයේ පිහිටි කඳුකරය භූගෝලීය හා පාරිසරික වෙනස්කම් මත රක්වාන කඳු, මධ්‍යම කඳු හා දුම්බර හෙවත් නකල්ස් යනුවෙන් උප කඳුකර පන්ති තුනකට වෙන්කොට ඇත. මේ කඳු පන්ති තුනටම පොදු වූ සත්ත්ව හා ශාක විශේෂ මෙන්ම මේ එකිනෙකට පමණක් සීමා වූ හෙවත් ඊටම ආවේණික වූ සත්ත්ව හා ශාක විශේෂ ද වේ. එබැවින් පරිසර විද්‍යාත්මකව මෙම කලාප ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ජීව විවිධත්වය අතින් අතිශයින්ම වැදගත් වන්නේ තෙත් කලාපය බව මෑතකදී කරන ලද පර්යේෂණවලින් සනාථ වී ඇත. ඉහත දැක්වූ කඳු පන්ති තුන ප්‍රධාන වශයෙන්ම තෙත් කලාපය තුළ පිහිටා තිබේ. එහි නැගෙනහිර කොටස් වියළි කලාපයට අයත් වේ. වියළි හා අන්තර් කලාපයේ අද දැකිය හැකි වන ආවරණය ඇත්ත වශයෙන්ම ඓතිහාසික සමයේදී ජනාවාසව තිබී පසු කලෙක නැවත ඇතිවූ වනාන්තර වේ. මේ නිසා ඒවා ද්විතියික වනාන්තර ගණයට වැටේ. ඇත්ත වශයෙන්ම රත්නපුර පෙදෙස පිහිටා ඇත්තේ ජීව විවිධත්වය අතින් ඉතා ඉහළ අගයක් ඇති තෙත් කලාපයේ මධ්‍යයේ යැයි කීම වඩාත්ම නිවැරැදිය. වර්තමාන ජීව විවිධත්වය සම්බන්ධව පමණක් නොව වසර දහස් ගණනක් ඈතට දිවෙන සත්ත්ව හා මානව පරිණාම කතාන්දරයේ හෙවත් ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සාධක ද නොඅඩුව ලැබෙන නිසා මේ පෙදෙසේ අගය වඩාත් ඉහළ නැංවේ.



ශ්‍රී පාද අඩවියේ කඳුකර වැසි වනාන්තර (VW)

# රත්නපුරය හා ඒ ආශ්‍රිත පෙදෙසේ ජීව විවිධත්වය

රත්නපුරය පිහිටා ඇත්තේ මධ්‍යම කඳු පන්තියත්, රක්වාන කඳු පන්තියත් අතර වූ නිම්න භූමිය තුළය. මේ කලාපය ප්‍රධාන වශයෙන්ම කළු ගං ද්‍රෝණිය තුළ පිහිටා තිබේ. නැගෙනහිරින් වලව ගං ද්‍රෝණියටද අයත් වේ. රත්නපුරයේ පහත් පෙදෙස් මුහුදු මට්ටමේ සිට දළ වශයෙන් මීටර් 30 ක උසින් පිහිටිය ද එම සීමාවේ පරාසය මුහුදු මට්ටමේ සිට මීටර් 2243 ක් දක්වා උස් ශ්‍රී පාද අඩවිය දක්වා ද පැතිරේ. භූ විෂමතාවය අතින් අධික බෑවුම් සහිත පෙදෙසකි රත්නපුරය. ශ්‍රී ලංකාවේ අධිකතම වර්ෂාපතනය වන වාර්ෂිකව මිලිමීටර් 6000 ක වර්ෂාවක් මේ කලාපයට ලැබේ. වසර මුළුල්ලේම වර්ෂාව ලැබුණත් මේ කලාපයට ප්‍රධාන වශයෙන් වර්ෂාව ලැබෙන්නේ මැයි සිට සැප්තැම්බර් දක්වා අතරතුර කාලයේ ලැබෙන නිරිතදිග මෝසම් වර්ෂාවෙනි.



කඳුකර වනාන්තර (VW)

වසර පුරාම ලැබෙන අධික සූර්යාලෝකයත්, අඛණ්ඩව ලැබෙන වර්ෂාවත් නිසා රත්නපුර හා ඒ ආශ්‍රිත පෙදෙස වසා පැතිර ඇත්තේ හොර ගස් ප්‍රමුඛ ශාක ප්‍රජාවකිනි. රත්නපුරයට දකුණින් පිහිටි සිංහරාජ වන ආවරණය හා ඒ ආශ්‍රිත ශාක හා සත්ත්ව ප්‍රජාව එලෙසම මේ කලාපයේ ද පැතිර ඇත. හොර කුලයට අයත් (*Dipterocarpaceae*), බු හොර (*Dipterocarpus hispidus*), හොර (*D. zeylanicus*), රත් දුරුල්ල (*Hopea jucunda*), බෙරලිය දුන් (*Shorea affinis*),

තීනිය දුන් (*S. congestiflora*) හා නවඳ (*S. stipularis*) ආදී විශාල ගස් රත්නපුර පළාතේ ස්වාභාවික පරිසරයන්හි දැකිය හැකිය. පහත් බිම් කලාපයන්හි ප්‍රමුඛතම වෘක්ෂ කුලය හොර ය. එසේ වුවද ඇටඹ (*Mangifera zeylanica*), වල් දෙල් (*Artocarpus nobilis*), වලු කීන (*Calophyllum bracteatum*), කැකුණ (*Canarium zeylanicum*) හා කිතුල් (*Caryota urens*) යන වෘක්ෂ ද මෙහි වඩාත් සුලභ වේ. මෙහි වූ අධික ආර්ද්‍රතාවය හෙවත් ජල වාෂ්ප ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගන්නා නිසා සෑම අඟුමුල්ලකම පර්ණාංග ශාක දැකිය හැකිය. මේ පර්ණාංග තෙතමනය ඇති සෑම තැනකම ද, මහා වෘක්ෂ මත අපිශාක ලෙස ද වැඩේ. රත්නපුරයට ඊසාන දෙසින් පිහිටා ඇති ශ්‍රී පාද අඩවිය පරිසර විද්‍යාත්මකව ඉතා අගනා බිම් පෙදෙසක් ලෙස හැඳින්විය හැකිය. තවමත් හරි හැටි ගවේෂණය නොකළ මේ කලාපයේ පහත් පෙදෙස් පහතරට තෙත් වනාන්තරවලින් ආවරණය වී තිබේ. විශේෂයෙන් උස් මට්ටම මීටර් 1000-1500 ඉක්මවන කලාපය කඳුකර වන ප්‍රජාව නියෝජනය කරයි. දැනට මෙරට ඉතිරිව ඇති තෙත් කලාපීය වනාන්තර අතරින් ජීව විවිධත්වයෙන් අනූන ශ්‍රී පාද අඩවිය නිසා රත්නපුර පෙදෙසට අති විශාල පරිසර විවිධත්වයක් හිමි වේ. ශ්‍රී පාද අඩවියේ උස් කඳුකරය ආවරණය කරනුයේ ප්‍රධාන වශයෙන්ම තෙල් කීන (*Calophyllum walkeri*), මිහිරිය (*Gordonia ceylanica*), රතු මිහිරිය (*G. speciosa*), තිත්ත වෙරළු (*Elaeocarpus glandulifer*), බදුල්ල (*Semecarpus nigro-viridis*), අලි කන් (*Actinodaphne speciosa*) ආදී කඳුකර වෘක්ෂයන්ගෙනි. මෙබඳු විවිධත්වයක් දරන මේ කලාපය තුළ උඩවැඩියා, ආරෝහක වැල්, තෘණ ආදී ශාකයන්ගේ ඉතා ඉහළ විවිධත්වයක් දක්නට ලැබීම ද විශේෂයෙන් සඳහන් කළ යුතුය. විශේෂයෙන්ම මේ ඉහළ කඳුකරයේ විවෘත තෘණ පඳුරු අතර වැවෙන මහරත්මල් (*Rhododendron zeylanicum*) ගස් වනාන්තරයට සුන්දරත්වයක් එක් කරයි. ඒ වසර පුරාම එහි හටගැනෙන රත්පැහැ විශාල මල් නිසාය.



*Acavus* ගණයේ ගොළුබෙල්ලෙක් (SN)

රත්නපුරය හා ඒ ආශ්‍රිත කලාපය අප රටට ආවේණික වූ සතුන්ගෙන් ගහනව පවතී. වර්ෂා වන ආවරණය තුළ වසන මේ සතුන් බොහොමයක්ම පොදුවේ මුළු තෙත් කලාපය පුරාම දැකිය හැකිය. සෙවන හා තෙතමනය ඇති ගස් කඳන් මත ජීවත්වන *Acavus* ගණයට අයත් පුවක් ගොළුබෙල්ලන් අප රටට ආවේණික අපෘෂ්ඨවංශී සත්ව කාණ්ඩයකි. පරිසරයට ඉතා සංවේදී සතුන්

වන උන් වියළි තත්ත්වයන් යටතේ කිසි විටෙක හමුනොවේ. මෙහි වූ සෑම දිය කඩිත්තකම ශ්‍රී ලංකාවට ආවේණික කූණිස්සන්, ලොකු අඩු ඉස්සන් හා මිරිදිය කකුළුවන් ජීවත් වේ. මේ සතුන් මෙරට ජීව විවිධත්වයේ ඉතා වැදගත් නියෝජනයක් සහිත සත්ව කාණ්ඩයක් ලෙස හඳුන්වා දිය හැකිය.

## මිරිදිය මසුන්

පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩ අතර මිරිදිය මසුන්ට හිමිවන්නේ ඉතා වැදගත් ස්ථානයකි. කළු ගං ද්‍රෝණිය තුළ වූ ඉතා කුඩා දොළ පාරවල සිට ගැඹුරු දිය දක්වා වූ අති මහත් ජල පද්ධතිවලට අනුවර්තනය වුණු මිරිදිය මත්ස්‍ය විශේෂ රාශියක් මේ කලාපයේ ජීවත් වේ. ලේ තිත්තයා (*Puntius titteya*), බුලත් හපයා (*P. nigrofasciatus*), දෙපුල්ලියා (*P. cumingii*), ජොන්ක්ලාස් ඇහිරාවා (*Lepidocephalichthys jonklaasi*) හා ඉරි ඇහිරාවා (*Schistura notostigma*) තුරු



බුලත් හපයා

වදුලින් ආවරණය වුණු සෙමෙන් ගලන දොළවල වසන අප රටට ආවේණික වූ ප්‍රමාණයෙන් කුඩා මිරිදිය මසුන් වේ. හල්මල් දණ්ඩියා (*Rasboroides vaterifloris*) හා මල්පුළුට්ටා (*Malpulutta kretseri*) කුඩා දොළවල ජීවත් වන ශ්‍රී ලංකාවට ආවේණික ඉතාම කුඩා මිරිදිය මත්ස්‍ය විශේෂ ලෙස දැක්විය හැකිය. ගැඹුරු හා වේගයෙන් ගලන ගංගාවල ජීවත්වන ලෙහෙල්ලා (*Tor khudree*), හීන මස්සා (*Puntius pleurotaenia*) ප්‍රමාණයෙන් විශාල මිරිදිය මසුන් වේ. දිය ඇලි පතිත වන, අධික වේගයෙන් ජලය ගලන ස්ථාන වාසස්ථාන කරගත් ගල්පාන්ඩියා (*Garra ceylonensis*), රතු වල්ග වැලිගොව්වා (*Sicyopterus halei*) හා රතු තොල් වැලිගොව්වා



ඉරි ඇහිරාවා



හල්මල් දණ්ඩියා

(*Sicyopus jonklaasi*) වේගයෙන් ගලායන ජලයට මනා අනුවර්තන දක්වන මසුන් වේ. තල්කොස්සා (*Belontia signata*) පැහැදිලි හා ගලායන ජලයේ සෙවන ඇති තැන්වල වසන සුලභ මත්ස්‍යයෙකි. සිරුර රතු හා නිල් වර්ණයෙන් යුක්තය. බල ප්‍රදේශ වෙන් කරගෙන ජීවත් වේ.



රතු තොල් වැලිගොව්වා

## උභයජීවීන්

වර්ෂා වනාන්තර ආවරණය හා තෙත් පරිසරය උභයජීවී විශේෂ රැසකටම මනා වාසස්ථාන වනු ඇත. උභයජීවීන් ප්‍රිය කරනුයේ වාතයේ ආර්ද්‍රතාවය ඉහළ, තෙත් හා සූර්යාලෝකය අඩුවෙන් ලැබෙන පරිසරයන්ටය. රත්නපුර හා ඒ ආශ්‍රිත කලාපය උභයජීවීන්හට මනා තෝතැන්නක් වන්නේ මේ තත්ත්වයන් එහි ඇති නිසාය. එබැවින් මේ කලාපය තුළ උන් බොහොමයක් දැකිය හැකිය. බොහෝ ආදිකල්පික පරිණාමික ලක්ෂණ දරන වකරැලි දිය මැඩියා (*Lankanectes corrugatus*) වඩාත්ම හමුවන්නේ වනය තුළ වූ කුඩා වගුරුවලය. මේ මැඩියා වසර මිලියන 65 ක පමණ සිට ස්වාධීනව පරිණාමය වූ ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්වයෙකි. තෙත් ගල් මත ජීවිතයට පූර්ණ වශයෙන් අනුවර්තනය වී ඇති ලංකා ගල්පර දිය මැඩියා (*Nannophrys ceylonensis*) පැතලි සිරුරක් දරයි. මේ පෙදෙසේ වූ තෙත් ගල් මත මේ මැඩියාගේ වැඩිහිටියන් මෙන්ම ඉස්ගෙඩියන් ද හමුවේ. මේ මැඩි විශේෂය ශ්‍රී ලංකාවට ආවේණික වනවා මෙන්ම තෙත් කලාපයේ පහත රටට පමණක් සීමා වී පැතිර ඇත.



වක රැලි දිය මැඩියා (MM)



ලංකා ගල්පර මැඩියා (MM)



කුඩා කහ හිරිදණ්ඩා (SL)



කෙලාර්ට්ගේ කුරු ගෙම්බා (SL)



කොටගමගේ ගෙම්බා (MM)

පාද රහිත පණුවන් ආකාර උභයජීවීන් දෙදෙනෙක් මේ කලාපයේ ජීවත් වේ. ඒ, කහ හිරිදණ්ඩා (*Ichthyophis glutinosus*) හා කුඩා කහ හිරිදණ්ඩා (*I. pseudangularis*) විශේෂයන්ය. උන් බුරුල් පස් අතර හා වැසි වනයේ ඇළ දොළ ඉවුරුවල ජීවත් වේ. රාත්‍රියේ හෝ අධික වැසි දිනයන්හි පමණක් පොළොව මතුපිටට පැමිණේ. උන්ගේ ශරීරය දෙපස කහ පැහැ තීර දෙකක් වේ. කෙලාර්ට්ගේ කුරු ගෙම්බා (*Adenomus kelaarti*) මෙහි වූ ඇළ දොළ දෙපස ජීවත් වන අප රටට ආවේණික ගෙම්බෙකි. සිහින් දිගටි සිරුරක් ඇති මේ විශේෂයට ගස් නැගීමේ හැකියාවද ඇත. කොටගමගේ ගෙම්බා (*Bufo kotagamai*) හා නොලර්ට්ගේ ගෙම්බා (*Bufo noellerti*) මිනිස් වාසයෙන් අඩු, වැසි වනාන්තරවල ද ඉඳහිට වනය මායිමේ වූ ගෙවතුවල ද දක්නට ලැබේ. නගාඕගේ මොට හොඹු මැඩියා (*Ramanella nagaoi*) ගස් මත වූ දිය පිරි බෙනවල වසයි. උන්ගේ ඉස්ගෙඩි අවස්ථා ද මේ බෙන තුළම ජීවත්වීම සුවිශේෂී අනුවර්තනයකි. දුඹුරු මොට හොඹු මැඩියා (*R. obscura*) විශාල ගස් මුල් අතරේ වූ දිය කඩිති තුළ බිත්තර හෙළන මැඩි විශේෂයකි. මේ මැඩියා වනයේ මෙන්ම ගෙවතුවල ද ජීවත් වේ. තඹවන් දිය මැඩියා (*Rana temporalis*) ඇළ දොළ දෙපස වූ ගල් මත ජීවත්වන ප්‍රමාණයෙන් විශාල මැඩියෙකි. මොවුන් දිවා කල පවා හඬ නගනු ඇත. පඳුරු මත ජීවත්වන පඳුරු මැඩියන්ගේ විවිධත්වය

මේ පෙදෙසේ වසන සත්ත්ව කාණ්ඩ අතර සුවිශේෂත්වයක් දරයි. මෙහි ගෙවතුවල මෙන්ම ලඳු කැලෑවල ද, මහා වනාන්තරවල ද ඒ ඒ පරිසර නිකේතනයන්ට ආවේණික වූ පඳුරු මැඩි විශාල සංඛ්‍යාවක් ජීවත් වේ. හිරිගඩු පඳුරු මැඩියා (*Philautus cavirostris*) හා ජාලාභ පඳුරු මැඩියා (*P. reticulatus*) වනයේ උස් ගස් මත ජීවත්වන පඳුරු මැඩියන් වේ. උන්ගේ හඬ සවස් කල හා රාත්‍රියේ උස් ගස් මතින් ඇසිය හැකිය. වකුටු කොළ පඳුරු මැඩියා (*P. folicola*) වනයේ වූ පඳුරු අතර ඇති වියළී ඇකිලී ගිය කොළ තුළ තම නිකේතනය කරගෙන ජීවත් වේ. තියුණු හොඹු පඳුරු මැඩියා (*P. cuspis*) අඳුරු වනය තුළ දිරායන කොළ රොඩු අතර ජීවත්වන දිගු හොම්බක් ඇති සත්ත්වයෙකි. අඳුරු ලපවන් පඳුරු මැඩියා (*P. sordidus*) ගල් මත ජීවිතයට අනුවර්තන දක්වන්නෙකි. උගේ දුඹුරු පුල්ලි සහිත සිරුර ගල් මත ජීවිතයට මනා ලෙස හැඩගැසී ඇත. සුලභ පහිඹු ගස් මැඩියා (*Polypedates cruciger*) මිනිස් වාසස්ථානවල වසයි. දික්-හොඹු ගස් මැඩියා (*P. longinasus*) සෙවනැති විශාල වනාන්තරවලට ප්‍රිය කරයි. මේ විශේෂ දෙකම තම බිත්තර තැන්පත් කරනුයේ උන් විසින්ම තනන ලද පෙන කැදැල්ලකය. ඉහත දක්වා ඇත්තේ මේ කලාපයේ හමුවන තෝරාගත් උභයජීවී විශේෂ සංඛ්‍යාවක් පමණකි. උන් සියලු දෙනාම අප රටට ආවේණික වේ.



නොලර්ට්ගේ ගෙම්බා (AN)



වකුටු කොළ පඳුරු මැඩියා (MM)



දුඹුරු මොට හොඹු මැඩියා (SL)



දික් හොඹු ගස් මැඩියා (RP)

# උරගුන්



පුංචි අං කටුස්සා (SL)

සිව්පා උරගුන් හා සර්පයින්ගේ විවිධත්වය රත්නපුරය හා ඒ ආශ්‍රිතව ඉතා පොහොසත් මට්ටමක පවතී. පහත රට වර්ෂා වනාන්තරවල සිට ශ්‍රී පාද අඩවියේ උස් පෙදෙස් දක්වා දිවෙන කඳුකර වනාන්තර දක්වා වූ අතරතුර කලාපයේ ඇති අතිමහත් වූ නිකේතන වෙන් කරගෙන උන් ජීවත් වේ. වඩාත් සෙවනැති, වනයේ දිරා යන කොළ රොඩු අතර පුංචි අං කටුස්සා (*Ceratophora aspera*) වසයි. ශ්‍රී පාද අඩවියේ ඉහළ කලාපයේ කඟමුව අං කටුස්සා (*C. stoddartii*) ජීවත් වේ. මේ කටුසු විශේෂ දෙකම ශ්‍රී ලංකාවේ සත්ත්ව පරිණාමය තුළ සුවිශේෂත්වයක් දක්වන්නේ උන් මෙහි මුල්ම පදිංචිකරුවන් නිසාය. වනයේ සීරස් ගස් මත ජීවත් වන කරමල් බෝදිලියාගේ (*Lyriocephalus scutatus*) නාසය මත ගෝලාකාර නෙරීමක් ඇත. පෙඳ පාසි සහිත කඳුකරයේ වූ ගස් මත ජීවත් වන්නෙකි කුරු බෝදිලියා (*Cophotis ceylanica*). කුරු බෝදිලියාට යමක් ග්‍රහණය කළ හැකි පරිග්‍රාහී වල්ගයක් ඇත. පිරිමි කටුස්සාගේ පුළුල් තැල්ලක්



කඟමුව අං කටුස්සා (SL)



කඳු බෝදිලියා (SL)



කලා කටුස්සා (SL)

ගෙලේ ඇති කලා කටුස්සා (*Otocryptis wiegmanni*) වනාන්තරයේ දිරා යන කොළ රොඩු අතර වසයි. අප රටට ආවේණික වු මේ කටුස්සා පහතරට තෙත් කලාපීය වනාන්තරවලදී පහසුවෙන් දැකගත හැකිය.



පුල්ලි වක නිය සුහුනා (SL)



දිවා සැරි සුහුනා (SB)

රත්නපුරය හා ඒ ආශ්‍රිත වනාන්තරවල සුහුනු විශේෂ රැසක් හමුවේ. ගල් බිත්ති, ගල් පැළුම්, පොළොවේ වු ගල් හා දිරා යන ගස් කඳන් සුහුනන්ට මනා වාසස්ථාන වේ. පුල්ලි වක නිය සුහුනා (*Geckoella triedra*) මනා ලෙස හෙවන ඇති තෙත් සහිත පොළොවේ බුරුල් ගල් හා කඳන් යට සැඟවී ජීවත් වේ. තද කළු පැහැ මේ සුහුනාගේ සිරුරේ කහ පුල්ලි ඇති අතර වල්ගය කෙටි හා මහත් වේ. පටු හිසැති වක නිය සුහුනා (*Cyrtodactylus cracens*) වනයේ ගල් බිත්ති හා රළු කඳන් මත සැරිසරන ප්‍රමාණයෙන් විශාල සත්ත්වයෙකි. ලා දුඹුරු පැහැ සිරුරේ පළල් තද දුඹුරු පුල්ලි දැකිය හැකි මේ සත්ත්වයාගේ හිස විශාලව පෙනේ. ප්‍රමාණයෙන් ඉතා කුඩා දිවා සැරි සුහුනන් (*Cnemaspis* spp.) සෙවනැති තැන්හි ගල් බිත්ති හා ගස් කඳන් අතර වසයි. බොහෝ සුහුනන් නිශාචර වුවත් මේ කුඩා කඩිසර සුහුනන් දිවා කල ක්‍රියාශීලී වේ. හැලි සුහුනා (*Hemidactylus depressus*) වැසි වනාන්තරවල මෙන්ම නිවෙස් තුළ ද වාසය කරයි. දුඹුරු පැහැ සිරුරේ තද දුඹුරු පුල්ලි දැකිය හැකි අතර වල්ගයේ සුදු හා තද දුඹුරු තීරු පිහිටයි. වනයේ පෙඳ පාසි ගහන ගල් බිත්ති හා ගස්වල රළු පොතු අතරේ ජීවත් වේ. ශ්‍රී ලංකාවට ආවේණික වු මේ සුහුනන් සුපරීක්ෂාකාරීව පරීක්ෂා කොට බැලුවහොත් වන ආවරණය තුළදී නිරීක්ෂණය කළ හැකිය.

සිව්පා උරගුන් අතරින් සිකනලුන් රත්නපුරය හා ඒ ආශ්‍රිතව සුලභව හමුවන සත්ත්ව කාණ්ඩයකි. ස්මිත්ගේ සර්ප හීරළුවා (*Nessia burtonii*) හා අංගුලි සර්ප හීරළුවා (*N. monodactylus*) වනයේ දිරායන කොළ රොඩු හා වැටුණු ගස් කඳන් අතර ජීවත් වේ. උන්ගේ ගාත්‍රා ක්ෂීණ වී ගොස් ඇති අතර බැලු බැල්මටම සර්පයෙකු මෙන් පෙනේ.

ටේලර්ගේ ලක් හීරළුවා (*Lankascincus taylori*) සහ ගැන්ස්ගේ ලක් හීරළුවා (*L. gansi*) දිගු වල්ගයක් ඇති, ගාත්‍රා හා ඇඟිලි පැහැදිලිව පිහිටන, කොළ රොඩු හා දිරායන කඳන් අතරේ ගැවසෙන, අඳුරු පැහැයට හුරු සතුන් වේ. නිවර්තන වැසි වනාන්තරවල තවත් බොහෝ සිකනල් විශේෂ ජීවත් වේ. *Mabuya* ගණයේ සතුන් ඊට උදාහරණ වේ. කෙසේ වුවත් ඉහතින් දක්වා ඇති ශ්‍රී ලංකාවට ආවේණික සිකනලුන්ද ඇතුළු තවත් විශේෂ පහතරට කලාපවල සිට ශ්‍රී පාද අඩවිය හා ඒ ආශ්‍රිත අනෙකුත් වනබද පෙදෙස්වල වාසය කරයි.

රත්නපුරය හා ඒ අවට ප්‍රදේශය අතිමහත් වූ සර්ප සමූහයක් ජීවත්වන කලාපයකි. මල් කරවලා (*Balanophis ceylonensis*) ඉතා අලංකාර භෞමික සර්පයෙකි. කුඩා කල අඳුරු පැහැ සිරුරේ තැඹිලි පැහැ පුල්ලි පිහිටයි. උන් කොළ රොඩු අතර කඩිසරව ගමන් කරයි. දීප්තිමත් කළු පැහැ සිරුරේ සුදු පැහැ තීරු හා පුල්ලි දරන නිර්විෂ සර්පයෙකි දාර කරවලා (*Cercaspis carinatus*). විසකුරු කරවලුන්ගේ පෙනුමක් තිබුණත් බිම වසන නිර්විෂ සතෙකි. කබර දත් කැටියා (*Oligodon calamarius*) මතුපිටින් දුඹුරු පැහැ වුවත් යටි පෙදෙස කළු හා සුදු පැහැයෙන් රටා ගැන්වී ඇත. මේ නිර්විෂ සර්පයා රත්නපුර හා ඒ ආශ්‍රිත වනාන්තර තුළ ජීවත් වේ.


නිදි මාපිලා (SL)


මල් කරවලා (RS)


දාර කරවලා (RS)


දෙපත් නයා (RS)

පොළොන් තෙලිස්සා (*Hypnale hypnale*) හා මූකලන් තෙලිස්සා (*H. nepa*) කොළ රොඩු අතර ජීවත්වන විෂ සහිත සර්පයින් වේ. උන්ගේ විශේෂත්වය නම් එකිනෙකාට වෙනස් වූ වර්ණ රටා පෙන්නුම් කිරීමයි. අප රටට ආවේණික මූකලන් තෙලිස්සා මහ වනාන්තරවල හමුවන අතර පොළොන් තෙලිස්සා මනුෂ්‍ය වාසස්ථානවල ජීවත් වේ. පළා පොළඟා (*Trimeresurus trigonocephalus*) පහතරට වැසි වනාන්තර තුළ රුක් මත වසන විෂ සහිත සර්පයෙකි. දිවා කල නිසොල්මන්ව වාසය කරන අතර රාත්‍රියේ ක්‍රියාශීලී වේ. අප රටට ආවේණික මේ සර්පයා සෙවනැති පඳුරුවල, විශේෂයෙන් වනයේ වැවී ඇති බට පඳුරු මත සුලභව හමුවේ. දාර පිඹුරා (*Python molurus*) රත්නපුර පෙදෙසේ බහුලව වාර්තාවන සර්පයෙකි. සුනඛයන් ගිලීමට නිවෙස් කරා ඇදේ. වනාන්තර තුළ ඇළ දොළ අසලදී නිරීක්ෂණය කළ හැකිය.


කබර දත්කැටියා (RS)


ලේ මාපිලා (RS)

රාත්‍රී කාලයේදී වනාන්තර, ලඳු කැලෑ හා මනුෂ්‍ය වාසස්ථානවලදී හමු විය හැකි සර්පයින් අතර මාපිලුන් විශේෂ තැනක් ගනියි. මඳ විෂ ඇති මාපිලුන් සිහින් හා දිගටි සිරුරු දරයි. නිශාචරයින් නිසා උන්ගේ ඇස් විශාලය. පඳුරු මාපිලා (*Boiga barnesii*), නාග මාපිලා හෙවත් ලේ මාපිලා (*B. forsteni*) හා නිදි මාපිලා (*B. ceylonensis*) මෙහිලා විශේෂයෙන් සඳහන් කළ හැකිය. මීට අමතරව කොළ රොඩු, බුරුල් පස් හෝ ගල් යට, කඳන් යට ජීවත් වන නිර්විෂ කුඩා සර්ප කාණ්ඩයකි මැඩිල්ලන්. සිහින් දිගටි උන්ගේ හිස මහත් නොවේ. පැහැදිලි ගෙලක් නොදරයි. තැඹිලි හෝ දීප්තිමත් රත් පැහැයට හුරු ලේ මැඩිල්ලා (*Aspidura brachyorrhos*), කුඩා මැඩිල්ලා (*A. guentheri*), කෙටි වලිග මැඩිල්ලා (*A. drummondhayi*) රත්නපුරය හා ඒ ආශ්‍රිත ස්වාභාවික පරිසරයන්හි ජීවත් වේ. ශ්‍රී පාද අඩවියේ ඉහළට යත්ම දලව මැඩිල්ලා (*A. trachyprocta*) හමුවේ. මේ සර්පයින් සියල්ලම පාහේ ශ්‍රී ලංකාවට ආවේණික වේ. පොළොවේ ගුල් හාරා ජීවත් වන සර්පයින් වන තුඩැල්ලන් (*Rhinophis* spp.) මෙම පරිසරයේ හමුවන නිර්විෂ සතුන්ය. මේ සර්පයින්ට අමතරව උග්‍ර විෂැති තිත් පොළඟා (*Daboia russelii*) හා නාගයා (*Naja naja*) විශේෂයෙන්ම මෙම කලාපයේ පිහිටි මානව වාසස්ථානවල ඉතා සුලභය.



කටකළුවා (RS)



තිත් පොළඟා (RS)

මේ සර්පයින්ට අමතරව ගෙවතු හා වනාන්තර ආශ්‍රිතව ඉතා සුලභ සර්ප විශේෂ ගණනාවක් හමුවේ. දෙපත් නයා (*Cylindrophis maculatus*), ඇහැටුල්ලා (*Ahaetulla nasuta*) කටකළුවා (*Coelognathus helena*), වයිරි හාල්දණ්ඩා (*Dendrelaphis caudolineolatus*) තුරු හාල්දණ්ඩා (*D. tristis*), අළු රදනකයා (*Lycodon aulicus*), මල් රදනකයා (*L. osmanhilli*), කබර රදනකයා (*L. striatus*), අරනි දත් කැටියා (*Oligodon arnensis*) පුල්ලි දත් කැටියා (*O. sublineatus*), වයිරි දත් කැටියා (*O. taeniolata*) හා කබර දත් කැටියා (*O. calamarius*) මෙහිදී විශේෂයෙන් සඳහන් කළ හැකිය. මේ සර්පයින් සියල්ලම පාහේ නිර්විෂ වේ. මේ අතර උග්‍ර විෂ කරවලෙකු වන දුනු කරවලා (*Bungarus ceylonicus*) මේ ප්‍රදේශය ආශ්‍රිතව ඉඳහිට වාර්තා වේ.



කබරගොයා (AN)

මේ කලාපය ආශ්‍රිතව කළු ගඟ හා ඊට ආසන්නයේ ඇති වගුරු ඉතා සුලභය. මීට අමතරව කළු ගඟ පිටාර ගැලීම නිසා නිතරම පාහේ ඒ ආශ්‍රිතව තාවකාලික ජලාශ හා වගුරු ඇති වේ. මේ ජලජ පරිසරයන් අතර කබරගොයින් (*Varanus salvator*), ගල් ඉබ්බන් (*Melanochelys trijuga*) හා කිරි ඉබ්බන් (*Lissemys punctata*) යන උරගුන්ද ජීවත් වේ. මීට අමතරව තලගොයා ද (*Varanus bengalensis*) මේ කලාපය ආශ්‍රිතව දුලභ නැත. මෙසේ බලන කල රත්නපුරය, ශ්‍රී පාද අඩවිය හා ඒ ආශ්‍රිත පෙදෙස් උරග විවිධත්වය අතින් ඉතාමත්ම පොහොසත් කලාපයක් බවට නිගමනය කළ හැකිය.

## පක්ෂීන්

ගංගා, ඇළ, දොළ, වගුරු, ගෙවතු, ලඳු කැලෑ හා වියන සහිත නිවර්තන වනාන්තරවල සිට වඩාත්ම උස්, මුහුදු මට්ටමේ සිට මීටර් 1500ට ඉහළින් පිහිටි වළාකුල් වනාන්තර දක්වා වෙනස් වන මේ කලාපය ඇත්ත වශයෙන්ම පක්ෂීන්ට ජීවත්වීමට, කැදලි තැනීමට ආදී සියලුම අවශ්‍යතාවයන් සඳහා මනා පරිසරයක් සකසයි. මේ හේතුව නිසාම රත්නපුරය හා ඒ ආශ්‍රිත කලාපවල විශාල පක්ෂීන් සංඛ්‍යාවක් ජීවත් වේ. මේ කලාපයේ අප රටට ආවේණික පක්ෂි ප්‍රතිශතය ද වඩා ඉහළ අගයක පවතී. මීට අමතරව කුඹුරුවල කොකුන්, දිය කාවුන්, පිළිහුඩුවන්, කොරවක්කන්, කිතලුන් ආදී ජලය ආශ්‍රිතව ජීවත්වන පක්ෂීන් වාසය කරයි. සිංහරාජ වනයේ හමුවන පක්ෂීන් සියල්ලම පාහේ මේ කලාපය තුළින් වාර්තා වේ. පිටරටින් පැමිණෙන පක්ෂීන් ද ඒ ආකාරයෙන්ම මේ පෙදෙසින් වාර්තා වේ. ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් අතුරින් විශාලතමයා වන ශ්‍රී ලංකා වලි කුකුළා (*Gallus lafayetii*) ළඳු කැලෑවල සිට විශාල වනාන්තර දක්වා ඉතා විශාල පාරිසරික කලාපයක පැතිර ඇත. ශ්‍රී ලංකා හබන්-කුකුළා (*Galloperdix bicalcarata*) වඩාත්ම ප්‍රිය කරනුයේ අඳුරු හා තෙත් වනාන්තරවලටය. මේ විශේෂ දෙකම භෞමික පක්ෂීන් වන අතර උන්ටම වෙන් කරගත් ප්‍රදේශ තුළ ජීවත් වේ.


වලි කුකුළා (VW)

ශ්‍රී ලංකා අළු ගිරවා (*Psittacula calthropae*) මෙහි වූ සෑම පහත් පෙදෙසකම පාහේ රංචු වශයෙන් ජීවත් වේ. උන් ඉතා ඉහළින් පියාඹන අතර දිරාගිය විශාල ගස්වල වූ බෙන තුළ බිත්තර තැන්පත් කරයි. ශ්‍රී ලංකා ගිරාමලිත්තා (*Loriculus beryllinus*) මහ වනාන්තරවල මෙන්ම ලඳු කැලෑ හා මනුෂ්‍ය වාසස්ථානවල ද එක ලෙස ජීවත් වේ. ආහාරයට සුදුසු ඉදුණු පළතුරු ඇති තැන්හි උන් දැකිය හැකිය. ඉතා වේගයෙන් පියාඹන ගිරා මලිත්තා බොහෝ විට හුදෙකලාව දැකිය හැකිය. ශ්‍රී ලංකා වත රතු මල්කොහා (*Phaenicophaeus pyrrhocephalus*) විශාල වනාන්තර තුළ ජීවත්වන නිශ්ශබ්ද පක්ෂියෙකි. බොහෝ දුරට විශාල කෘමීන් මත යැපෙන මේ පක්ෂියා අනෙකුත් පක්ෂීන් සමඟ සාමූහිකව ජීවත් වේ. මුහුණ රත් පැහැ නිසා වත රතු මල් කොහා යන නම ලැබී ඇත. ශ්‍රී ලංකා බට ඇටිකුකුළා (*Centropus chlororhynchus*)



ශ්‍රී ලංකා කැහිබෙල්ලා (VW)

ගෙවතුවල හමුවන ඇටිකුකුළාට බොහෝ දුරට සමාන වුවද හොට ලා කොළ පැහැතිය. දැකගැනීම තරමක් අපහසු වුවත් ඝන වනාන්තරයේ යටි වියනේ හටගන්නා බට පඳුරු අතර ජීවත් වේ. බට ඇටි කුකුළා කටුස්සන්, ගොළුබෙල්ලන් ආදී කුඩා සතුන් දඩයම් කර ආහාරයට ගනියි. ශ්‍රී ලංකා රන්මුණත් කොට්ටෝරුවා (*Megalaima flavifrons*) ගෙවතු , ලඳු කැළෑ හා ද්විතියික වනාන්තරවල හටගන්නා ගැඩුඹ (*Trema orientalis*) ගස්වල හටගන්නා ඵල කෑමට බොහෝ ප්‍රියතාවක් දක්වයි. එමෙන්ම ගෙවතුවල වවන පළතුරු කෑමට ද ඒවාට පැමිණේ. ශ්‍රී ලංකා කැහිබෙල්ලා (*Urocissa ornata*) යුගල් වශයෙන් හෝ රංචු වශයෙන් මහ වනාන්තරවල හමුවේ. මුහුදු මට්ටමේ සිට පහත් කලාපවල සිට උස් වනාන්තර දක්වා එක ලෙස පැතිරීමක් දරයි. රතු , නිල් හා සුදු පැහැයෙන් වර්ණ ගැන්වී ඇති කැහිබෙල්ලාට ඌටම ආවේණික වූ තියුණු හඬක් ඇත. වනයේ ඇළ දොළ අසල වූ උස් ගස් කැදලි තැනීම සඳහා බොහෝ විට තෝරා ගනියි. ශ්‍රී ලංකා වත සුදු ශාරිකාවා (*Sturnus albofrontatus*) විශාල වනාන්තරවල උස් ගස් මුදුන්වලට වඩාත් ප්‍රිය කරයි. බොහෝ දුරට රංචු වශයෙන් ජීවත් වේ. ශ්‍රී ලංකා සැලළිහිණියා (*Gracula ptilogenys*) තියුණු හඬක් ඇති බොහෝ ඉහළින් පියාඹන පක්ෂියෙකි. සැලළිහිණියන් යුගල ලෙස හෝ කුඩා රංචු වශයෙන් ජීවත් වේ. උන් වියළී ගිය උස් ගස්වල ඉහළම මට්ටම්වල බෙන තුළ කැදලි තනයි. වනයේ වූ ඉදුණු ඵල කෑමට පහළ මට්ටම්වලට පැමිණේ. ශ්‍රී ලංකා කහ කන් කොණ්ඩයා (*Pycnonotus penicillatus*) ශ්‍රී පාද අඩවියේ වූ උස් කලාපවල ජීවත්



ශ්‍රී ලංකා කහ කන් කොණ්ඩයා (VW)


ශ්‍රී ලංකා රතු දෙමලිච්චා (VW)

වේ. උන් ප්‍රධාන වශයෙන් එල හා ගෙඩි මත යැපේ. ශ්‍රී ලංකා රතු දෙමලිච්චා (*Turdoides rufescens*) මෙහි වූ සෑම කලාපයකම වාසය කරයි. හොඳින් තුරු සෙවන ඇති ගෙවතුවලත්, විශාල වනාන්තරවලත් එක ලෙස ජීවත් වේ. සාමාන්‍යයෙන් එක් රංචුවක කුරුල්ලන් 5-15 ක් අතර සංඛ්‍යාවක් වේ. සර්ව භක්ෂක රතු දෙමලිච්චා සෑම විටම පාහේ හඬ නගයි. ශ්‍රී ලංකා අළු දෙමලිච්චා (*Garrulax cinereifrons*) මහා වනාන්තර තුළ ජීවත් වේ. බොහෝ විට රතු දෙමලිච්චා සමඟ හමුවේ. සර්ව භක්ෂකයෙකි. ශ්‍රී ලංකා බොරග දෙමලිච්චා (*Pellorneum fuscocapillum*) ළඳු කැලෑවලට බොහෝ ප්‍රියකරන පක්ෂියෙකි. කුඩා රංචු වශයෙන් ජීවත් වේ. බොරග දෙමලිච්චාගේ තියුණු හඬ බොහෝවිට උදය හා සවස් කාලවලදී පැහැදිලිව ඇසිය හැකිය. ශ්‍රී ලංකා මයිල පරෙවියා (*Columba torringtoni*) කඳුකර ජීවිතයට වඩාත්ම ප්‍රිය කරයි. රත්නපුර හා ඒ ආශ්‍රිත උස් කලාපවල වූ වනාන්තරවල දුලභ නොවන පක්ෂියෙකි. ශරීරය අඳුරු පැහැ වුවත් ගෙල පිටුපස කළු හා සුදු වර්ණ රටාවත්, රත්පැහැ පාදත් නිසා පහසුවෙන් හඳුනාගත හැකිය. ශ්‍රී ලංකා දෑ-දෙමලිච්චා (*Pomatorhinus horsfieldii*) වත සුදු, කහ හොටැති, දුඹුරුවන් පිටක් ඇති, ඇසට ඉහළින් සුදු තීරුවක් සහිත ඉතා අලංකාර පක්ෂියෙකි. තුරු සෙවන ඇති ගෙවතුවල මෙන්ම මහ වනාන්තරවල ද එක ලෙස හමුවේ. උන් සවස් කල රංචු වශයෙන් හඬ නගමින් ගසින් ගසට යාම සාමාන්‍ය සිරිත වේ. ශ්‍රී ලංකා අළු කෑදැත්තා (*Ocyceros gingalensis*) ඕනෑම පරිසරයක හමුවන පක්ෂියෙකි. නිතරම පාහේ එළුවෙකු මෙන් හඬ නගන මේ කෑදැත්තා බෙන තුළ කැදලි තනයි. හුදෙකලාව හෝ යුගල් වශයෙන් බොහෝ විට ජීවත් වේ. ගම්මානවල ද සුලභ වේ. ඉදුණු ගෙඩි කෑමට එසේ පැමිණේ. ශ්‍රී ලංකා නිලන-මැසිමාරා (*Eumyias sordida*) අඳුරු නිල් පැහැතිය. මේ මැසිමාරාවා ගෙවතුවල මෙන්ම මහ වනාන්තරවල ද ජීවත් වේ. විශේෂයෙන්ම ඇළ දොළ දෙපස වූ සෙවනැති තැන්හි තුරු මත හිඳ කෘමීන් දඩයම් කරයි. එතරම් සිත්ගන්නා වර්ණ රටාවක් නොදරයි. ශ්‍රී ලංකා වනරැවියා (*Bradypterus palliseri*) කඳුකරයේ ජීවත්වන අඳුරු පැහැ, ප්‍රමාණයෙන් කුඩා පක්ෂියෙකි. මානා පඳුරු, බට පඳුරු හෝ ඕනෑම පඳුරක සැඟවී ජීවත් වේ.

## ක්ෂීරපායින්

ක්ෂීරපායීන් ගැන සලකා බලන කල කුඩා හික්මීයන්ගේ සිට අලියා දක්වා වූ අති විශාල විශේෂ සංඛ්‍යාවක් මේ පෙදෙසින් වාර්තා වේ. වියළි කලාපීයව වසන තිත්මුවන් හා වලසුන් මෙහි හමුනොවුණද පොදුවේ අනෙකුත් සියලුම ක්ෂීරපායීන් මෙහි වාර්තා වේ. කුඩා හික්මී විශේෂයන් කිහිපයක්ම (*Solisorex pearsoni, Suncus etruscus, S. fellowes-gordoni* හා *S. zeylanicus*) මේ කලාපයේ හමුවේ. උන් අප රටට ආවේණික වේ. වනාන්තරයේ දිරා යන කොළ රොඩු අතර කුඩා සතුන් ඇහිඳ කමින් ජීවත් වේ. මේ කලාපයේ වූ ගල් ගුහා, ගල් ආවරණ, විශාල ගස් බෙන තුළ කිරි වවුලන් හා ඵල භක්ෂක වවුලන් බොහෝ සේ ජීවත් වේ. උන් ගෙවතු ආශ්‍රිතව ද වාසය කරයි. විශේෂයෙන්ම ඵල භක්ෂක වවුලන් ගෘහාශ්‍රිතව වැවෙන පළතුරු කෑමට පැමිණේ.

අප රටට ආවේණික රිළවා (*Macaca sinica*) හා කොළ වඳුරා (*Trachypithecus vetulus*) මහ වනාන්තරවල මෙන්ම මානව වාසස්ථානවල ද එක ලෙස පැතිරී ඇත. උන් ගෘහාශ්‍රිතව වවන ඵල හා ඵළවළු බුදීමට නිතරම පාහේ ගෙවතුවලට පැමිණේ. මේ විශේෂ දෙක පහතරට


රිළවා (VW)


කොළ වඳුරා (VW)


උණහපුළුවා (VW)


ශ්‍රී ලංකා මුකලන් ලේනා (VW)

වන මායිම්වලදී පහසුවෙන් දැක බලාගත හැකිය. ශ්‍රී ලංකා උරුවන්-තිරාසිකයා (*Myophonus blighi*) කඳුකරයේ පමණක් හමුවේ. ශ්‍රී පාද අඩවියේ ඇළ දොළ දෙපස වූ බට පඳුරුවල එළිමහන් තැන්හි සැරිසරයි. සමහර අවස්ථාවලදී 3-4 බැගින් වන රංචු වශයෙන් දැකිය හැකිය. ශ්‍රී ලංකා තිත්පිය තිරාසිකයා (*Zoothera spiloptera*) පහතරට හා කඳුකරයේ මධ්‍යම කලාපයේ මහ වනාන්තරවල සෙවනැති අඳුරු තැන්හි හිඳ තම සුමියුරු හඬ නිකුත්කරන දුඹුරු හා සුදු තිත්වලින් අලංකාර වූ සිරුරැති පක්ෂියෙකි. බොහෝ විට ඇළ දොළ අසල දිරායන කොළ රොඩු අතර හමුවන කුළෑටි පක්ෂියෙකි. ශ්‍රී ලංකා කායුරු තිරාසිකයා (*Zoothera imbricata*) දුඹුරු පැහැ උඩු කයක් හා පිහාටු අග කළුවන් අඩසඳ හැඩැති, මහ වනයේ අඳුරු පොළොවේ වසන පක්ෂියෙකි. ගැඹුරු හා කෙටි නාදයක් ඇති මේ පක්ෂියා පහත් වැසි වනාන්තර හා කඳුකරයේ වූ වනාන්තරවල ජීවත් වේ. ශ්‍රී ලංකා පිළිලිච්චා (*Dicaeum vincens*) කුඩා කඩිසර පක්ෂියෙකි. උඩු පැත්ත තද නිල් පැහැයට හුරුය. බොහෝ විට යුගල් වශයෙන් ගැවසේ. ගෙවතුවල වූ ගැඩුඹ ආදී කුඩා ඇට හා ගෙඩි හටගන්නා ගස් කරා පැමිණෙන අතර බෝවිටියා කෑමටද ප්‍රියකරයි. නමුත් කැදලි තනන්නේ ඉතා උස් ගස්වල මුදුනේය. රත්නපුර හා ඒ අවට දුලභ නැත. ශ්‍රී ලංකා සිතැසියා (*Zosterops ceylonensis*) ගේ හිස හා පිට කහවන් කොළ පැහැතිය. යටි කය සුදු පැහැ වන අතර ඇස වටා සුදු පැහැ වළල්ලක් දරයි. ජෝඩු වශයෙන් හෝ කුඩා රංචු වශයෙන් ගසින් ගසට සැරිසරන්නේ ඉදුණු පළතුරු ආහාරයට ගැනීමටය. කඳුකරයට ප්‍රියකරන අතර ගෙවතුවල ද දැකිය හැකිය.

මේ සඳහන් කර ඇති ආවේණික පක්ෂීන්ට අමතරව තවත් ආවේණික විශේෂ මේ කලාපය තුළ හමුවන බව කිව යුතුය. එමෙන්ම ආවේණික නොවන පක්ෂීන් ඉතා විශාල ප්‍රමාණයක් ද මෙහිදී දැකගත හැකි වේ. ඊට පර්යටන පක්ෂීන්ද අයත් වේ. මෙහිදී බස්සන්, උකුස්සන්, රාජාලියන් ඇතුළු පහතරට වැසි වනාන්තරවලටත් උස් කඳුකර වනාන්තරවලටත් සීමා වූ පක්ෂීන් ඉතා විශාල ප්‍රමාණයක් සිහිපත් කළ හැකිය. සමස්තයක් ලෙස ගත් කල රත්නපුරය හා ඒ ආශ්‍රිත කලාපය පක්ෂි විවිධත්වය අතින් වඩා පොහොසත් භූමි ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකිය.


ශ්‍රී ලංකා අළු කෑදැත්තා (VW)


කොටියා හෙවත් දිවියා (VW)

වැසි වනාන්තරවල සිට වඩාත්ම උස් වළාකුල් වනාන්තර දක්වා පැතිර ඇත. හිවලා (*Canis aureus*), දිවියා හෙවත් කොටියා (*Panthera pardus*), කොළ දිවියා (*Prionailurus rubiginosus*) හා හඳුන් දිවියා (*P. viverrinus*) මෙහි වූ සෑම පරිසර පද්ධතියකම පාහේ දැකිය හැකිය. උන් සියල්ලම පාහේ උග්‍ර මාංශ භක්ෂකයින් වේ. ගෘහාශ්‍රිතව මෙන්ම වනාන්තරවලද එක ලෙස ජීවත්වන හෝතඹුවන් (*Herpestes brachyurus, H. edwardsi, H. smithii* හා *H. vitticollis*) විශේෂ හතරම මේ කලාපයේ දුලභ නැත. උන් සර්පයින් ඇතුළු කුඩා සතුන් මත යැපේ. දිය බල්ලා (*Lutra lutra*) මෙහි වූ සෑම ජල පද්ධතියකම පාහේ ජීවත් වේ. නිවෙස් අසල නිතරම වාගේ හමුවන උගුඩුවා (*Paradoxurus hermaphoditus*) එල හා මාංශ භක්ෂකයෙකි. උන් වනාන්තරවලට සීමා නොවී නිවෙස් අසල ද ජීවත්වන්නේ ඒවායේ වසන සතුන් හා එල බුදීමටය. ශ්‍රී ලංකාවට ආවේණික රන් කළුවැද්දා (*P. zeylonensis*) රන්වන් පැහැ, රුක්වැසි, එල හා මාංශ භක්ෂකයෙකි. රන් කළුවැද්දා වනයට වඩාත් ප්‍රියකරයි. උරුලෑවා (*Viverricula indica*) සුදු හා කළු වර්ණ රටාවක් ඇති සතෙකි. වනයේත්, නිවෙස් අසලත් එක ලෙස හමුවන අතර කුඩා සතුන් දඩයම් කරයි. ශ්‍රී පාද අඩවියේ 3-4 ක පමණ වූ අලි (*Elephas maximus*) රංචුවක් වාසය කරයි. උන් ඉතා සීඝ්‍රයෙන් වඳවෙමින් පවතී. තෙත් ඝන වනාන්තරවලට වඩා අලින් ප්‍රිය කරනුයේ වියළි තැනිතලා බිම්වලටය. කෙසේ වුවත් ශ්‍රී පාද අඩවියේ වාසය කරනුයේ තෙත් කලාපයේ ඉතිරිව ඇති අවසාන අලි කීපදෙනාගෙන් කොටසක් බව කිව යුතුය.

ගෝනා (*Cervus unicolor*), වැලි මුවා (*Muntiacus muntjak*), වල් ඌරා (*Sus scrofa*) හා මී මින්නන් (*Moschiola meminna* හා *M. kathygre*) මෙහි වූ ගෙවතු, ලඳු කැලෑ, පහතරට වැසි වනාන්තර හා උස් කඳුකර වනාන්තර දක්වා එක ලෙස පැතිර වසයි. මේ අතරින් මී මින්නන් අප රටට ආවේණිකය. උන් නිවෙස් ආශ්‍රිතවද ඉතා සුලභව හමුවේ. මීට අමතරව ඉත්තෑවා (*Hystrix indica*), කබල්ලෑවා (*Manis crassicaudata*) හා වල් හාවා (*Lepus nigricollis*) නිවෙස් අසල වූ ලඳු කැලෑවල සුලභය. උන් මහ වනයේද එක ලෙස හමුවේ. මෙයින් ඉත්තෑවා හා කබල්ලෑවා උස් කඳුකර වනාන්තරවල ඉතා දුලභය. ගස් මත වසන දඬුලේනා (*Ratufa macroura*) මෙහි වූ සෑම තැනකම පාහේ දැකිය හැකිය. කඳුකරයේ දඬුලේනා හා පහත් කලාපයේ දඬුලේනා අතර ශාරීරික වෙනස්කම් දැකිය හැකිය. අප රටට ආවේණික ශ්‍රී ලංකා දෙපහේ කටු හීන්-මීයා (*Mus mayori*), ශ්‍රී ලංකා නෙළු මීයා

(*Rattus montanus*), ශ්‍රී ලංකා දෙපැහේ මීයා (*Srilankamys ohiensis*), ශ්‍රී ලංකා ගස් මීයා (*Vandeleuria nolthenii*) මෙහි වූ නිවර්තන වැසි වනාන්තරවල හමුවන කෘන්තකයින් වේ. මොවුන්ට අමතරව තවත් මී විශේෂ ගණනාවක්ම මෙහි වාර්තා වේ. සමහර විශේෂ මනුෂ්‍ය වාසස්ථානවලට පමණක් සීමා වී ඇත. මේ මීයන්ට අමතරව වනාන්තරයේ අඳුරු සෙවනැති ගස් කඳන් අතරේ ජීවත්වන ලේනුන්ද වේ. ශ්‍රී ලංකා මුකලන් ලේනා (*Funambulus layardi*) පුංචි ලේනා (*F. sublineatus*) හා ගෘහාශ්‍රිතව සැරිසරන ලේනා ද (*F. palmarum*) මෙහිදී සඳහන් කළ හැකිය. ලේනුන් කුඩා සතුන් මෙන්ම ඵල හා ඇට වර්ග ආහාරයට ගනියි. රත්නපුරය හා ඒ ආශ්‍රිත කලාපයේ වර්තමානයේ වල් මීමුන් (*Bubalus bubalis*) ජීවත් වන බවට වාර්තා වී නැත. ශ්‍රී ලංකාවේ කඳුකර පළාත් රැසක කැලෑවල වල් මීමුන් ජීවත් වුවත් මේ පෙදෙසේ එසේ වාර්තා නොවේ. කෙසේ වුවත් ලැබෙන පොසිල සාධක අනුව ඈත අතීතයේ මෙහි කුළු මීමුන් ජීවත්ව ඇත. රත්නපුරය හා ඒ ආශ්‍රිත කලාපය ආවේණික මෙන්ම ආවේණික නොවන ක්ෂීරපායීන් බහුලව ජීවත්වන කලාපයක් බව මේ අනුව පැහැදිලි වේ. එකිනෙකට වෙනස් පාරිසරික හා භූගෝලීය තත්ත්වයන් මත අනුවර්තනය වීම් යටතේ මේ විවිධත්වය වැඩි වී ඇති බව සිතිය හැකිය.


වල් ඌරා (VW)


වැලි මුවා (SN)


ගෝනා (SN)

# ප්‍රාග් ඓතිහාසික වැදගත්කම

රත්නපුරය පෙදෙස ලොව සුපතල වන ලෙස ප්‍රාග් ඓතිහාසික වැදගත්කමකින් යුක්තය. ඒ ප්‍රධාන කාරණා දෙකක් හේතුකොටගෙනය. මින් පළමුවැන්න මානව විද්‍යානුකූල නූතන මානවයා හෙවත් *Homo sapiens* ගේ ආදිතම ජනාවාස, එම මානවයන් භාවිත කළ ශිලා හා සත්ත්ව අස්ථිවලින් නිර්මිත මෙවලම් එමෙන්ම ඔවුන් අනුභවකොට ඉතිරි වූ සත්ත්ව හා ශාක ශේෂ මේ පෙදෙසේ ගල්ගුහා තුළින් හමුවීමය. දෙවැන්න මීට වසර ලක්ෂ කීපයකට එපිට ජීවත් වූ විශාල ක්ෂීරපායී සතුන්ගේ පාෂාණීභූත වූ ශරීර කොටස් හෙවත් පොසිල මේ භූමියෙන් හමුවීමය.



ව්‍යාඝ්‍රයෙකුගේ පහළ චාර්වක දත

රත්නපුරය, කුරුවිට, අවිස්සාවේල්ල, කලවාන ඇතුළු ඒ ආශ්‍රිත තවත් බොහෝ පෙදෙස්වලින් මීට වසර දහස් ගණනකට එපිට ජීවත් වූ විශාල ක්ෂීරපායීන් ඇතුළු තවත් සත්ත්ව සමූහයකගේ පොසිල හමුවේ. පසුගිය සියවසේ මැද භාගයේ සිටම මේ පිළිබඳව පර්යේෂණ පැවැත්වීමට මුලපුරන ලද්දේ එවකට කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ධුරය හෙබවූ අප රට බිහිවූ ශ්‍රේෂ්ඨතම ස්වභාව විද්‍යාඥයා වූ නැසීගිය පී. ඊ. පී. දැරණියගල මහතා විසින්ය. රත්නපුරය ආශ්‍රිත මැණික් පතල් හා ඇළ දොළවලින් මේ පොසිල හමුවේ. මැණික් පතල්වල වූ ඉල්ලම්වලින් මේ පොසිල විශාල ප්‍රමාණයක් මේ වන විට හමු වී තිබේ. ඉන් බොහෝ ප්‍රමාණයක් කොළඹ ජාතික කෞතුකාගාරයේද තවත් කොටසක් රත්නපුර කෞතුකාගාරයේද ඉතිරිය එංගලන්තයේ ලන්ඩන් නුවර පිහිටි ස්වාභාවික විද්‍යා කෞතුකාගාරයේද තැන්පත් කොට ඇත. මැණික් ඉල්ලමේ දියළු පස් අතර හමුවන මේ පොසිල ප්‍රධාන වශයෙන්ම දත් හා අස්ථි කැබලි වේ.

අධික බෑවුම් හා වසර මුළුල්ලේම ඇදහැලෙන වර්ෂාව හේතුවෙන් රත්නපුර හා ඒ ආශ්‍රිත කලාපයේ නිතරම පාහේ සෝදාපාළුව මඟින් ගසාගෙන යන පාංශු කොටස් පහත් දෙණිවල තැන්පත් වේ. එම නිසා මේ පොසිල නිතරම හමුවන්නේ ඉල්ලම් පස්වල හා ගංගා පතුල්වලය. මේ හේතුව නිසා කිසිම අයුරකින් මියගිය සතුන්ගේ පූර්ණ සැකිලි පොසිල වශයෙන් හමු නොවේ. එයට හේතුව එකල සතා මියගිය ස්ථානයේ සිට මේ සැකිලි හා දත් යම් දුරක්

බැවුම් දිගේ වැසි ජලය සමඟ රුටා ගොස් තිබීමය. පුරාවිද්‍යාත්මකව සලකා බැලූ කල මේ පොසිල හමුවන මැණික් පතල් හෝ ගං පතුල්වල පස් ක්‍රමානුකූල ස්ථරායනයක් අනුව තැන්පත් වී නැත. ඒවා ද්විතීයික තැන්පතු වේ. මේ නිසාම මේ පොසිල නිසියාකාරව කාල නීර්ණය කිරීමේ හැකියාවක් නැත. කෙසේ වුවත් රත්නපුරය ආශ්‍රිතව හමුවන පොසිල ඉන්දියාවේ නර්මදා හා ශිවාලික් තැන්පතු අතරේ හමුවන පොසිලවලට හැම අතින්ම සමානය. එකල රත්නපුරයේත්, ශිවාලික් හා නර්මදා ප්‍රදේශවලත් ජීවත්ව ඇත්තේ එකම පරපුරකට අයත් සත්ත්ව සන්තතියකි. සංසන්දනාත්මක අධ්‍යයනවලට අනුව රත්නපුර පොසිල අයත් වන්නේ භූ ඉතිහාසයේ අවසානතම අවධීන් වූ ප්ලයිස්ටොසීන (Pleistocene) හා හොලෝසීන (Holocene) අවධීන්වලටය. ප්ලයිස්ටොසීන අවධිය අදින් වසර ලක්ෂ 18කට (මිලියන 1.8කට) පෙර ආරම්භ වී අදින් වසර 10,000-12,000කට එපිටදී නිමා විය. අද අප සිටින්නේ හොලෝසීන අවධියේය. *Homo sapiens* ලොවට බිහි වූයේ ප්ලයිස්ටොසීන අවධියේය. මේ අනුව බලන කල නූතන සත්ත්වයන්ගේ හා ශාකවල පැතිරීම, නූතන මානවයා අප්‍රිකාවේ බිහිවීම හා ඔහු ලොව පුරා පැතිරීම ඇතුළු සත්ත්ව හා පරිසර විද්‍යාත්මකව ඉතා සුවිශේෂ වූ ක්‍රියාවලි රැසක්ම මේ අවධිය තුළ සිදු විය.

ශ්‍රී ලංකාවේ ප්ලයිස්ටොසීන අවධියට අයත් පොසිල ප්‍රධාන වශයෙන්ම හමුවන්නේ රත්නපුරය ආශ්‍රිතවය. පසුගිය දශක 06කට වැඩි කාලයක සිටම මේ පර්යේෂණ සඳහා විශාල දායකත්වයක් මෙහි වූ මැණික් කර්මාන්තයේ යෙදුණු අයගෙන් ලැබිණි. ඒ, ඔවුන් තම මැණික් ඉල්ලමෙන් හමුවන



මේ පොසිල කොටස් ජාතික කෞතුකාගාරය වෙත ලබාදීමෙන් මෙම මාහැඟි කර්තව්‍යයට දායක වී ඇති නිසාය. ඔවුන් ඉතා පරිස්සමින් මේ කාර්යය ඉටු නොකරන්නට අපට තවමත් වසර දස දහස් ගණනකට එපිට ජීවත් වූ මේ පොසිලගත වූ සතුන් පිළිබඳ අදහසක් නොලැබෙන්නට ඉඩ තිබුණි.



එකල හිපොපොටේමස් ජීවමානව සිටි ආකාරය




කඟවේනුන්ගේ චාර්වක දත් (වම්පස *Rhinoceros sinhaleyus* සහ දකුණේ *R. kagavena*)

මේ පොසිලගත වූ සතුන් අතර අදින් වසර ලක්ෂයකට හෝ ඊට ප්‍රථම ජීවත් වූ විශාල ක්ෂීරපායින් තිදෙනෙකු දැක්විය හැකිය. එනම් දැවැන්ත හස්තීන් විශේෂ දෙකක් මේ පළාතේ ජීවත්ව ඇත. පොසිල බවට පත්වූ උන්ගේ දත් හමු වී තිබේ. උන් විද්‍යාත්මකව *Elephas namadicus* හා *E. hysudricus* නම් වේ. මීට අමතරව මේ කාලයටම අයත් හිපොපොටේමස් විශේෂයකට (*Hexaprotodon sinhaleyus*) අයත් පොසිල බවට පත් වූ දත්, ගාත්‍රා හා හකු කොටස් බොහොමයක් රත්නපුර හා ඒ ආශ්‍රිත මැණික් පතල්වලින් හමුවී ඇත. මීට සමගාමීව ඉන්දියාවේ හා තවත් නැගෙනහිර ආසියානු රටවල් ගණනාවකම මේ අවධිය තුළ හිපොපොටේමස් වාසය කොට ඇති අතර අද උන් සියල්ලම පාහේ වඳවී ගොස් ඇත. ඉදිරි දත් හෙවත් කෘන්තක දත් 6ක් දැරීම නිසා මේ විද්‍යාත්මක නම ලැබී ඇත. (*Hexa* = හය, *proto* = ඉදිරි, *don* = දත්) කෙසේ වුවත් අවිස්සාවේල්ල සිට රත්නපුරය අතර වූ සමතල බිම් පෙදෙස එකල විශාල වගුරු පෙදෙසක් ලෙස තිබී ඇති බව හඳුනාගෙන තිබේ. එහි මේ හිපොපොටේමස් විශේෂය යහතින් ජීවත් වන්නට ඇතැයි විශ්වාස කෙරේ.



*Rhinoceros kagavena* නම් කඟවේනා ජීවමානව සිටි ආකාරය

කඟවේනුන් හෙවත් රයිනෝසිරස් විශේෂ දෙකකට අයත් පොසිල ද මැණික් පතල්වලින් හමුවේ. දැනටත් ආසියාවේ කඟවේනුන් විශේෂ 03ක් ජීවත් වේ. ශ්‍රී ලංකාවේ ජීවත්ව ඇති විශේෂ අතරින් ප්‍රමාණයෙන් විශාල සත්ත්වයා *Rhinoceros kagavena* ලෙසද, අනෙක් විශේෂය *R. sinhaleyus* ලෙසද විද්‍යාත්මකව නම් කොට තිබේ. පොසිල වූ දත්, අස්ථි කොටස් හා හකු සැලකිය යුතු ප්‍රමාණයක් මැණික් පතල් තුළින් හමුවී ඇත. දැනට කර ඇති කාලනිර්ණයන්ට



*Rhinoceros sinhaleyus* නම් කඟවේනා ජීවමානව සිටි ආකාරය

අනුව උන් අදින් වසර 80,000 කට එපිට මේ කලාපයේ ජීවත්ව ඇත. මේ විශේෂ දෙකම තනි අඟක් දරන රළු සමක් ඇති සතුන්ය. උන් වැසි වනාන්තරවල මෙන්ම සැවනා හා තෘණ බිම්වල ජීවත්වන්නට ඇත.

ගවරා (*Bos gaurus*) අප රට ජීවත්ව වඳවී ගිය ගව කුලයේ විශාලතම සාමාජිකයා වේ. ගවරා යනු කළු පැහැ සමකින් යුත්, ගාත්‍රාහි පහත කොටස් සුදු පැහැ, කෙටි හා වක් වූ අං යුගලක් දරන විශාල ක්ෂීරපායි සතෙකි. මීට වසර සියයකට පමණ එපිටදී ශ්‍රී පාද අඩවියේදී ගවරෙකු ඇසින් දුටු බවට සාක්ෂි වාර්තා වී ඇත. උඩරට රාජධානි සමය ගැන රොබට් නොක්ස් විසින් ලියන ලද An Historical Relation of The Island of Ceylon නම් ග්‍රන්ථයේ අප රටේ ගවරුන් සිටි බව දක්වා ඇත. කෙසේ වුවත් ගවරා මේ පොසිල සතුන් අතරින් අවසානයටම වඳ වූ සත්ත්වයා ලෙස නම් කළ හැකිය. ගවරුන් අදටත් කේරලයේ කඳු මත වූ තෘණ බිම් අතර වාසය කරයි. ශ්‍රී ලංකාවේ ගවරුන් ජීවත්වූ බවට දත්, ගාත්‍රා කොටස් හා හිස්කබල් කොටස් මෑණික් පතල්වලින් හමුවී ඇත. ශ්‍රී පාද අඩවිය මේ ගවරුන්ට මනා තෝතැන්නක් වන්නට ඇතැයි සිතිය හැකිය. අප රට ගවර මාන, ගවර මණ්ඩිය, ගවර ගිර, ගවර විල ආදී ග්‍රාම නාම මේ සත්ත්වයා ආශ්‍රිතව බිහිවන්නට ඇතුවාට සැක නැත.



ගවරා

රත්නපුර පෙදෙසින් නොවුණත් ගවයෙකුට (*Gona sinhaleya*) අයත්, පොසිල බවට පත් වූ අඟ ආශ්‍රිත හිස් කබලේ කොටසක් මැදිරිගිරිය පෙදෙසින් හමුවීම තුළින් හැඟී යන්නේ ප්ලයිස්ටොසීන සමයේ අප රට ගවයින් ජීවත් වූ බවය. මේ ගවයා ප්‍රමාණයෙන් බොහෝ කුඩා විශේෂයක් වන්නට ඇතැයි ලැබී ඇති පොසිලය අනුව උපකල්පනය කළ හැකිය.

බළල් පවුලට අයත් විශාල සාමාජිකයින් දෙදෙනෙකුගේ පොසිල මේ පෙදෙසින් හමුවේ. 1936 දී කුරුවිට අසල එදණ්ඩේවෙලින් හමුවූ සිංහයෙකුට (*Panthera leo*) අයත් හක්කේ වූ දත දැනට අප සතුව ඇති ඉතාම අගනා සිංහ පොසිලය වේ. මෙය මහා බ්‍රිතාන්‍යයේ ස්වභාව විද්‍යා කෞතුකාගාරයේ තැන්පත් කොට තිබේ. 1947 දී කුරුවිට ගෝනපිටියේ මැණික් පතලකින් සිංහයෙකුට අයත් රදනක දතක කොටසක්ද හමුවී ඇත. ශ්‍රී ලංකාවේ සිංහයින් ජීවත් වූ කාලපරිච්ඡේදය අපට තවම හරියාකාරව නීරණය කිරීම අපහසු වී ඇත.

සිංහයින් ඉතා සුළු වශයෙන් වර්ෂා වනාන්තරවලට ප්‍රිය කරයි. උන් වඩාත් කැමති තෘණ බිම් අධික, තැන තැන ගස් වැවුණු සැවනා බිම්වලටය. වර්තමානයේ ආසියාවේ සිංහයින් හමුවන්නේ ඉන්දියාවේ ගුජරාට් ප්‍රාන්තයේ ගිර් නම් වනයේ පමණි. උන් අනෙක් සියලුම පෙදෙස්වලින් වඳවී ගොස් හමාරය. කෙසේ වුවත් අදට වඩා වියළි දේශගුණයක් රත්නපුර හා ඒ ආශ්‍රිත

පෙදෙස්වල පැවැති කලෙක මේ සිංහයා මෙහි ජීවත් වන්නට ඇත. 1962 දී රත්නපුරයේ මුවගම පිහිටි මැණික් පතලකින් හමුවූ හක්කේ දත හා වලාදුරේ පිහිටි බටදොඹ ලෙනේ 05 වැනි පස් ස්ථරයෙන් හමුවූ මැද ඇඟිලි පුරුක ඉතා වැදගත් වන්නේ ඒවා ශ්‍රී ලංකාවේ ව්‍යාඝ්‍රයින් ජීවත් වූ බවට ඇති සාක්ෂි වන නිසාය. අප ව්‍යාඝ්‍රයා ඉංග්‍රීසියෙන් Tiger යනුවෙන් හඳුන්වන අතර විද්‍යාත්මකව *Panthera tigris* නම් වේ. අංගාර 14 කාලනීර්ණයට අනුව, බටදොඹ ලෙනෙන් හමුවූ ව්‍යාඝ්‍ර ඇඟිලි පුරුක අදින් වසර 17,000 ක් පමණ පැරණිය. ඒ, ශ්‍රී පාද අඩවියේ ජීවත් වූ ව්‍යාඝ්‍රයෙකු වූ අතර බටදොඹ ලෙනේ ජීවත් වූ මානවයා විසින් දඩයම් කොට මස් පිණිස ලෙන වෙතට ගෙන එන්නට ඇත. ඇත්ත වශයෙන්ම අප රටේ ප්ලයිස්ටෝසීන අවධියේ ජීවත්ව වඳවී ගිය සතුන් අතරින් නිසියාකාර කාලනීර්ණයක් ලැබී ඇත්තේ බටදොඹ ලෙනෙන් හමුවූ ව්‍යාඝ්‍ර ඇඟිලි පුරුකට පමණි. අදින් වසර 17,000 කට එපිට ශ්‍රී පාද අඩවිය, හෝර්ටන් තැන්න, සිංහරාජ අඩවිය ආදී පෙදෙස්වල ව්‍යාඝ්‍රයින් ජීවත් වන්නට ඇති අතර උන් ගවරුන් දඩයම් කරන්නට ඇතිවාට සැක නැත. සිංහයින් රංචු වශයෙන් ජීවත් වුවත් ව්‍යාඝ්‍රයින් හුදෙකලාව ජීවත් වන සතුන් වේ. ඉන්දියාවේ කේරලයේ අදටත් ව්‍යාඝ්‍රයින් වාසය කරයි. ශ්‍රී ලංකාවේ හමුවී ඇති ඇඟිලි පුරුකට අනුව අප රට ව්‍යාඝ්‍රයා ඉතා විශාල සතෙකු බව හඳුනාගෙන ඇත.


කුරුවිට බටදොඹ ලෙනෙන් හමුවූ අදින් වසර 17,000ක් පමණ පැරණි ව්‍යාඝ්‍ර ඇඟිලි පුරුක

මීට අමතරව දඩයම් බල්ලෙකුගේ පොසිලගත වූ රදනක දතක් කුරුවිට ගෝනපිටිය මැණික් පතලකින් හමුවී ඇත. විද්‍යාත්මකව *Cuon javanicus* යනුවෙන් හඳුන්වන මේ දඩයම් බල්ලා හිවලාටත්, සාමාන්‍ය බල්ලාටත් සමානකම් දරයි. දැනට ඉන්දියාවේ දඩයම් බල්ලන් ජීවත් වන අතර අප රට හමුවූ විශේෂය වඳවී ගිය සත්ත්වයෙකු ලෙස හඳුන්වා ඇත.

ඉහතින් විස්තර කළ අදින් වසර ලක්ෂයකට පමණ එපිට ශ්‍රී ලංකාවේ ජීවත් වූ විශාල හස්තීන් දෙදෙනාට අයත් පොසිල බොහොමයක් චාර්වක හා පුරස්චාර්වක දත් කොටස්ය. මේ හස්තීන් වඳවී ගිය හිපොපොටේමස් සමඟ සමකාලීනව ජීවත් වන්නට ඇතැයි අනුමාන කෙරේ. එම විශේෂ දෙක නම් *Elephas namadicus* සහ *E. hysudricus* ය. මේ විශේෂ වර්තමානයේ ජීවත්වන *E. maximus* ගෙන් වෙන්වන්නේ ප්‍රධාන වශයෙන්ම හිස් කබලේ හා දත්වල හැඩයෙනි.





වඳවී ගිය හස්තීන්ගේ චාර්වක දත් (වම් පස *Elephas namadicus* සහ දකුණු පස *E. hysudricus*)

ප්ලයිස්ටොසීන අවධියේ පොසිල අතර ගල් ඉබ්බෙකුගේ (*Melanochelys trijuga sinhaleya*) හා කිරි ඉබ්බෙකුගේ (*Lissemys punctata sinhaleya*) ශේෂ හමුවී ඇත. ගල් ඉබ්බන් හා කිරි ඉබ්බන් දැනුදු මේ පළාතේ වාසය කරන අතර හමුවී ඇති පොසිල වර්තමාන සතුන්ගෙන් වෙනස් වන ලක්ෂණ පෙන්නුම් කරනු ඇත. මීට අමතරව කිඹුලෙකුගේ (*Crocodylus* sp.) පොසිලගත වූ දතක් ද මේ මැණික් පතල්වලින් හමුවී ඇත.




*Melanochelys trijuga sinhaleya* නම් වඳවී ගිය ගල් ඉබ්බාගේ යටි එලකයේ කොටසක්

ඉහත කී විශේෂයන්ට අමතරව අලියා (*Elephas maximus*), වල් ඌරා (*Sus sinhaleyus*), මුවා (*Muva sinhaleya*), ගෝනා (*Cervus unicolor*), තිත් මුවා (*Axis ceylonensis*) හා කුළු හරකා (*Bubalus bubalis*) ඇතුළු තවත් සත්ත්ව විශේෂ කිහිපයකගේ පොසිල රත්නපුර හා ඒ ආශ්‍රිත මැණික් පතල්වලින් හමුවී ඇත. මුවා හැර අනෙක් සතුන් වර්තමානයේ පවා ශ්‍රී ලංකාවේ ජීවත්වන විශේෂ වේ.

මැණික් පතල් තුළින් හමුවී ඇත්තේ වඳ වී ගිය සතුන්ගේ පොසිල පමණක් නොවේ. මානව සැකිලි කොටස් ද හමුවී ඇත. කුරුවිට කරන්ගොඩ මැණික් පතලකින් හමුවූ ඇස් කුහරය අසල හිස් කබල් කොටස අභාවයට ගිය මානවයෙකුගේ (*Homo sinhaleyus*) බව හඳුනාගෙන ඇත. එය දැනට රත්නපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තබා ඇත. එය නූතන මිනිසුන්ගේ එම පෙදෙසට වඩා කුඩා බව හඳුනාගෙන ඇත. මීට අමතරව *Homopithecus sinhaleyus* යන විද්‍යාත්මක නමින් හඳුන්වන ලද මානවයෙකුගේ කෘන්තක දතක කොටසක් ද මේ පෙදෙසින් හමුවී තිබේ. එම පොසිලයද රත්නපුර කෞතුකාගාරයේ ප්‍රදර්ශනය කෙරේ. කෙසේ වුවත් මේ

මානවයින් නූතන මානව වර්ගීකරණයට අනුව වලංගු නොවන බවත්, ඒ පිළිබඳව වැඩි දුරටත් අධ්‍යයනය කළ යුතු බවත් කිව යුතුය.

මැණික් පතල්වලින් හමුවන ඉහත කී සත්ත්ව හා මානව පොසිලවලට අමතරව ආදි මානවයින් භාවිත කළ ශිලා මෙවලම්ද හමුවේ. කහඳ, තිරුවානා ආදී පාෂාණයන්ගෙන් නිර්මිත මේ රළු ශිලා මෙවලම් නිවැරැදි ලෙස කාලනීර්ණය කළ නොහැකි වුවත් මේවා අප රට ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් වැදගත් සාධක වේ. බලංගොඩ වලවේ ගං ඉවුරේ බෙල්ලන් බැඳි පැලැස්සෙන් මුලින්ම සොයාගන්නා ලද බලංගොඩ මානවයා හෙවත් අප රට විසූ ආදිතම මිනිසුන් පරිහරණය කළ මේ මෙවලම් පැහැදිලිව හඳුනාගත හැක්කේ පළපුරුදු අයෙකුට පමණි. මේ ශිලා මෙවලම්වලට අමතරව ආදී මානවයින් ගින්දර ඇවිලීම සඳහා යොදාගත්තා යයි සිතන විදින ලද රවුම් ගල් හා සිදුරු බොහෝ විදින ලද පැතලි ගල් හෙවත් කිණිහිර රත්නපුරය හා ඒ ආශ්‍රිතව පොළොව මතුපිටද හමුවේ.

 

පොසිල වූ මානව ශේෂ (වම් පස *Homo sinhaleyus* ට අයත් ඇස් කුහරය අසල හිස් කබල් කොටස සහ දකුණු පස *Homopithecus sinhaleyus* ගේ උඩු හනුවේ කෘන්තක දත)

## කුරුවිට බටදොඹ ලෙන

මුහුදු මට්ටමේ සිට දළ වශයෙන් මීටර 500ක් පමණ ඉහළින් කුරුවිට වලාදුරේ නම් ග්‍රාමයේ පිහිටි බටදොඹ ලෙන ලොව ඉතා ප්‍රචලිත වී ඇත්තේ නූතන මානවයාට අයත් පැරණිතම සාධක හමුවන ස්ථානය ලෙසිනි. දැනට දශක 06 කට නොවැඩි කාලයක සිට පී.ඊ.පී. දැරණියගල, ආචාර්ය සිරාන් දැරණියගල හා ආචාර්ය නිමල් පෙරේරා යන පුරාවිද්‍යාඥයින් විසින් මේ ගුහාව ආශ්‍රිතව කීප වතාවක්ම කැණීම් කර ඇත. මීට වසර 37,000 කට පමණ පෙර සිටම මේ ගුහාව මධ්‍ය ශිලා යුගයට අයත් ආදී මානවයින් පරිහරණය කළ බවට සාධක හමුවේ. ඔවුන් විසින් දඩයම් කරනු ලැබ පුලුස්සා කෑමට ගත් සත්ත්ව ශේෂ, ගොළුබෙලි කවච, තෙල් කැකුණ හා වල් දෙල් කොටස් මේ ගුහාවෙන් හමුවී තිබේ. මානව සැකිලි කොටස් ද හමුවීම භෞතික මානව විද්‍යාත්මකව ඉතා වැදගත්

වේ. රත්නපුර හා ඒ ආශ්‍රිතව මානවයින් වාසය කළ තවත් ගුහා හමුවී ඇතත් බටදොඹ ලෙන වැදගත් වන්නේ එහි ස්ථරායනය ඉතා නිරවුල්ව පිහිටීම හේතුවෙනි. මෙහි වූ මානවයින් විසින් පුලුස්සා කෑමට ගනු ලැබූ සත්ත්ව කොටස් ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් හමුවී තිබේ. ඔවුන් අලියාගේ සිට මීයා දක්වා නානාවිධ සතුන් දඩයම් කර ඇති බව පර්යේෂණවලින් පෙනී ගොස් ඇත. නමුත් බටදොඹ ලෙනේ විසූ මානවයා බෙහෙවින්ම ආහාරයට ගෙන ඇත්තේ වඳුරන්, රිළවුන්, දඬු ලේනුන්, උගුඩුවන්, කලවැද්දන් ආදී කුඩා සතුන් ද, වලිකුකුළන් හා හබන් කුකුළන් ආදී පක්ෂීන්ද වේ. මීට අමතරව විශාල ප්‍රමාණයේ ලෙහෙල්ලන් ද ආහාරයට ගෙන ඇත.

මේ ගුහාවෙන් හමුවූ අනෙකුත් දෑ අතර මධ්‍ය ශිලා යුගයට අයත් ජ්‍යාමිතික හැඩයෙන් යුත් ක්ෂුද්‍ර ශිලා මෙවලම් විශේෂ තැනක් ගනියි. මේවා බොහෝවිට තනා ඇත්තේ පළිගුවලිනි. ඉතා සූක්ෂමව තනා ඇති මේ ක්ෂුද්‍ර මෙවලම් මෙරට ගල් ආයුධ ඉතිහාසයේ ඉතාමත් දියුණු තාක්ෂණයක් විදහාපායි. මීට අමතරව ගං පතුල්වලින් සොයාගන්නා ලද දළ වශයෙන් අල්ලක් පමණ වූ රවුම් හැඩැති ගල් බටදොඹ ලෙනෙන් හමුවේ. මෙම ගල්වල සිදුරු විද තිබීම ඉතා වැදගත් ලක්ෂණයකි. සිදුරු එකක් හෝ දෙකක් හෝ තුනක් විදින ලද ගල් සුලභව හමුවන අතර පුරා විද්‍යාඥයන්ගේ මතය අනුව මේවා ගිනි මෙලවීම සඳහා උපයෝගි කරගෙන ඇත. එමෙන්ම සතුන්ගේ අස්ථි බිඳීම සඳහා මේ හා සමාන ශිලා මෙවලම් භාවිතා කර ඇත. මීට අමතරව සිදුරු



ආදි මානවයා ජීවත් වූ කුරුවිට පිහිටි බටදොඹ ලෙන




අදින් වසර 37,000 කට පමණ පෙර සිට බලංගොඩ මානවයින් (මෙරට විසූ මුල්ම මානවයින්) බටදොඹ ලෙනේ විසීය. ඔහු ගිනි මෙලවීමට දරන උත්සාහයක් මෙහි විශාල ප්‍රමාණයෙන් ඇඳ ඇති මානව රූපයෙන් දැක්වේ. ලෙන පුරා විසිරී ඇත්තේ සිය ගල් ආයුධ සහ ඔවුන් ආහාරයට ගෙන ඉවතලූ සත්ව අස්ථි කැබලි හා ගොළුබෙල්ලන්ය. මෙම රූපණය ගොඩනංවා ඇත්තේ කැණීම් සාධක පදනම් කරගෙනය.



පුරාවිද්‍යාත්මක කැණීම්වලින් ලැබී ඇති සැකිලි අනුව බලංගොඩ මානවයා රළු ඇහි බැම් වැටියක්, කෙටි හා පුළුල් නාසයක්, පුළුල් හා බර යටි හක්කක් සහ පැහැදිලි නිකටක් ඇත්තෙකි. එම සාධක උපයෝගී කොටගෙන බලංගොඩ මානවයාගේ මෙම උඩුකය රූපණය ගොඩනංවා තිබේ.

ගණනාවක් විදින ලද පැතලි ගල් මෙම ගුහාව තුළින් හමුවේ. මේවා කැකුණ ඇට තැලීම සඳහා භාවිතා කර ඇති බව පුරාවිද්‍යාඥයන්ගේ විශ්වාසයයි. ඉහත කී ශිලා මෙවලම්වලට අමතරව සත්ත්ව අස්ථිවලින් සාදන ලද උල් හැඩැති මෙවලම් මෙම ගුහාවෙන් සුලභව හමුවේ. ඒවා ගොළුබෙල්ලන් තුළ ඇති මස් ඉවත් කිරීමටත්, ඊතල හෝ හෙලි තුඩවල් වශයෙන් භාවිතා කිරීමටත් ඇති බව විශ්වාස කෙරේ. බටදොඹ ලෙනෙන් හමුවන අතිශය වැදගත් ද්‍රව්‍යයන් අතර සමුද්‍රයේ ජීවත් වන බෙල්ලන් හා මෝර හා මඩු මසුන්ගේ දත් හා ශරීර කොටස් මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතුය. සමුද්‍ර බෙල්ලන්, මෝර මසුන්ගේ දත් පළඳනාවන් ලෙස යොදා ගන්නට ඇති බව විශ්වාස කෙරේ. මේ අනුව බලන කල දකුණු ආසියාවේ ආදිතම මානව වාසස්ථානයක් වූ බටදොඹ ලෙනට ප්‍රාග් ඉතිහාස විෂය තුළ ඉතා වැදගත්කමක් හිමිවන බව කිව යුතුය. බටදොඹ ලෙනේ ජීවත් වූ මානවයා සතු වූ මෘත දේහ වැළලීම ඇතුළු අභිචාර විධි පිළිබඳ සාධක ද හමුවී තිබේ. ඔවුන් ගින්දර භාවිත කළ ආකාරය හා පවුල් අතරේ වූ අන්‍යෝන්‍ය සබඳතා පිළිබඳ තතුද මෙහි කළ කැණීම් මගින් අනාවරණය වී ඇත.

පසුගිය සියවසේ මැද භාගයේ පමණ පී.ඊ.පී. දැරණියගල මහතා විසින් බලංගොඩ අසල වලවේ ගං ඉවුරේ බෙල්ලන් බැඳි පැලැස්ස කැණීම් කොට මානව සැකිලි, මෙවලම් හා ඔවුන්ගේ ආහාරවල ශේෂයන් සොයා ගැනීමෙන් පසු 'බලංගොඩ මානවයා' පිළිබඳ සංකල්පය



ගිනි ඇවිලීම සඳහා යොදා ගන්නා ලදැයි අනුමාන කෙරෙන සිදුරු විදින ලද රවුම් හැඩැති ශිලා මෙවලම් සහ තැලීමට භාවිතා කරන ලද ශිලා මෙවලම්



සත්ත්ව අස්ථිවලින් නිර්මිත මෙවලම් (මේවා සියල්ලම පාහේ සෙන්ටිමීටර 6කට වඩා කුඩා වේ)



මෙය එළිමහන් වාසස්ථානයක හිඳ පළිඟු ගලකින් ආයුධයක් තනන බලංගොඩ මානවයා දැක්වෙන රූපණයකි.
ඔවුන් පරිහරණය කළ ජ්‍යාමිතික ක්ෂුද්‍ර මෙවලම් කිහිපයක්ද මෙහි වේ.

ප්‍රචලිත විය. ඇත්ත වශයෙන්ම බලංගොඩ මානවයා යනු අප රටේ ජීවත් වූ ආදිතම මානවයා වේ. බලංගොඩ මානවයා යන නම යොදන ලද්දේ ඔහුගේ තතු පළමුවෙන්ම බලංගොඩින් (බෙල්ලන් බැඳිපැලැස්ස) සොයාගත් නිසාය. නමුත් බලංගොඩ මානවයා ශ්‍රී ලංකාව පුරාම ජීවත් වූ බවට සාධක ලැබෙන බව ආචාර්ය සිරාන් දැරණියගල මහතා පවසයි. කුරුවිට අසල පිහිටි බටතොට ලෙනෙන්ද මේ මානවයා පිළිබඳ සාධක හමුවේ.

ප්‍රාග් ඓතිහාසික කැණීම්වලින් ලද සැකිල හා සැකිලි කොටස් අනුව අපට බලංගොඩ මානවයාගේ භෞතික ස්වරූපය පිළිබඳව යම් අදහසක් ලබාගත හැකිය. පිරිමින්, සෙන්ටිමීටර 167.8 සිට 173.8 ක්ද (අඩි 5 අඟල් 6 සිට අඩි 5 අඟල් 8 1/4) ගැහැණුන් සෙන්ටිමීටර 156.3 සිට 165.6 ක්ද (අඩි 5 අඟල් 1 1/2 සිට අඩි 5 අඟල් 4) උසැතිය. පිරිමින්ගේ කපාල ධාරිතාවය ඝන සෙන්ටිමීටර 1589.72 ක්ද ගැහැණුන්ගේ එය සෙන්ටිමීටර 919.66 ක්ද වේ. හිස් කබලේ අස්ථි සාපේක්ෂව ඝනකමින් වැඩිය. තල්ල විශාල හා පුළුල් වේ. යටි හනුව වැද්දන්ට සාපේක්ෂව ශක්තිමත් වන අතර දත් ප්‍රමාණයෙන් විශාල වේ. හමු වී ඇති අස්ථි අනුව උඩු හා යටි බාහු වැද්දන්ට වඩා මාංශලමය වේ. සමස්ථයක් වශයෙන් ගත් කල බලංගොඩ මානවයා ස්ථුල සිරුරකට හිමිකම් කියූ මානව කොටසක් විය.

2005 වසරේදී බටදොඹ ලෙනේ කැණීම් කළ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ආචාර්ය නිමල් පෙරේරා මහතා මෙහි සංස්කෘතික ස්ථරායනයේ සියුම් බව තවදුරටත් අධ්‍යයනය කළේය. එමගින් දකුණු ආසියාවේ ඉතා වැදගත්ම ආදී මානව ජනාවාසයක්ව පැවති මේ ගුහාව පිළිබඳව කරුණු තවදුරටත් ලොව හමුවේ අනාවරණය විය.



බෙල්ලන්බැඳි පැලැස්සේ විවෘත වාසස්ථාන කැණීමකින් හමු වූ බලංගොඩ මානවයාගේ යටි හක්කක්



ගුහා කැණීමකින් හමු වූ මානව කටී කශේරුකාවක කොටසක්

# සමාප්තිය

රත්නපුරය හා ඒ ආශ්‍රිත භූමියේ ජීව විද්‍යාත්මක වටිනාකම අප මෙහිදී සුළුවෙන් සාකච්ඡා කළත් ඒ ගැන තවදුරටත් කිව යුතු කරුණු කාරණා බොහෝය. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාවේ වනබද පෙදෙස් අතරින් මේ සා ජීව හා ප්‍රාග් ඓතිහාසික විවිධත්වයක් දරන එකම බිම් පෙදෙස මෙය බව කිව යුතුය. ප්‍රාග් ඓතිහාසික සාධක අතින් දකුණු ආසියාවේ සුවිශේෂිතම ගල් ගුහාව වන බටදොඹ ලෙන මේ කලාපය තුළ පිහිටීම නිසා රත්නපුරය හා ඒ ආශ්‍රිත කලාපයේ අගය දෙගුණ තෙගුණ වී ඇතුවාට සැකයක් නැත. කෙසේ වුවත් මානව ජනාවාස වැඩි දියුණු වීම, තේ, රබර් ඇතුළු බෝග වගාව හේතුවෙන් මෙහි වූ වන ආවරණය දිනෙන් දින ගිලිහෙමින් පවතී. අවිචාරවත් අයුරින් කෙරෙන මැණික් ගැරීම් ද මේ කලාපයේ ජීව විවිධත්වයට, විශේෂයෙන්ම මිරිදිය මසුන්ට බලවත් තර්ජන ගෙන දී ඇත. මීට අමතරව කෘෂි රසායන භාවිතය නිසා ද ජලජ ප්‍රාණීන්ට මෙන්ම භෞමික සතුන්ට ද හානිකර තත්ත්වයක් උදා වී ඇත. අතිශයින්ම වැදගත් රත්නපුරය හා ඒ ආශ්‍රිත කලාපය ආරක්ෂා කිරීම ශ්‍රී ලාංකිකයින් වශයෙන් අපගේ වගකීම වන බව තරයේ කිව යුතු වන්නේය. ඒ දැනට මෙහි ඉතිරි වී ඇති ස්වාභාවික වනාන්තර ආරක්ෂා කිරීමට අප අද සිටම කටයුතු නොකළහොත් හෙට දින එම උරුමය සදහටම අපට අහිමි වන හෙයිනි.

---


### ස්තුතිය

වනජීවීන් පිළිබඳවත් සත්ත්ව පුරාවිද්‍යාව පිළිබඳවත් අධ්‍යයනය කිරීමට බොහෝ සේ උපකාර කළ සුප්‍රසිද්ධ කීට විද්‍යාඥ නැසීගිය පුංචි බණ්ඩා කරුණාරත්න මහතාටත් මාගේ පර්යේෂණ සඳහා සැමදාමත් මා උනන්දු කළ වනජීවී උරුමභාර පුද්ගලික සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ රොහාන් පෙතියාගොඩ මහතාටත් පොසිල අධ්‍යයනයන් සඳහාත් ප්‍රාග් ඓතිහාසික කැණීම් සඳහාත් මට අවස්ථාව ලබාදුන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හිටපු අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය සිරාන් උපේන්ද්‍ර දැරණියගල මහතාටත් එම දෙපාර්තමේන්තුවේ කැණීම් හා කෞතුකාගාර අංශයේ සහකාර අධ්‍යක්ෂ ආචාර්ය නිමල් පෙරේරා මහතාටත් සහ කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල් ආචාර්ය නන්දා වික්‍රමසිංහ මහත්මියටත් මාගේ විශේෂ ස්තුතිය පිරිනැමේ. එමෙන්ම මේ පොත් පිංච සඳහා ඡායාරූප ලබාදීමෙන් මෙය වඩාත් සිත්ගන්නා අයුරු නිමකිරීමට උදව් වූ ඇන්ඩ්‍රියාස් නොලරට්, ආචාර්ය මාධව මීගස්කුඹුර, රුචිර සෝමවීර, සුදේශ් බටුවිට, සමන් ලියනගේ, සුදත් නානායක්කාර, විමුක්ති වීරතුංග යන මහතුන්ටත් වනජීවී උරුමභාර පුද්ගලික සමාගමටත් මාගේ ස්තුතිය පිරිනැමේ. මේ කර්තව්‍යය සඳහා මට මුල සිටම දැවැන්ත සහයෝගයක් දැක්වූ සී/ස ඇම්. ඩී. ගුණසේන සහ සමාගමේ එම්. ඒ. නඳුන් අමන්ද මහතාටත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පුඩි පෙරේරා මහතාටත් පරිසර අමාත්‍යාංශයේ ජෛව විවිධත්ව ලේකම් කාර්යාලයේ හසුලා වික්‍රමසිංහ මහත්මියටත් එම ආයතනයේ මනෝජ ප්‍රසන්න මහතාටත් මේ පොත් පිංච මනාලෙස හා කලාත්මක අයුරින් නිමකර මුද්‍රණය කරදුන් සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ සමාගමටත් මාගේ ස්තුතිය හිමිවේ.



ශ්‍රී ලාංකිකයින් බහුතරයකගේ ගෞරවයට පාත්‍ර වූ සමනල කන්ද හෙවත් ශ්‍රී පාද කන්ද රත්නපුරය හා නුවරඑළිය පෙදෙස්වල පිහිටා ඇත (SN)

ISBN 978-955-9120-86-5

මුද්‍රණය සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ